# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,685/4—1966 මාර්තු 8 වැනි අඟහරුවාද—8.3.1966

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංකය : ඩබ්ලිව 68/66 (3)

### මහාජන ආරක්ෂක ආඥාපනත

40 අධි.

රාජ්‍ය කටයුතු ඇමතිගේ නිර්දේශය අනුව, 40 වෙනි අධිකාරය වන මහාජන ආරක්ෂක ආඥාපනතෙහි 5 වෙනි වගන්තිය ාටතේ අග්‍රාණ්ඩුකාරවරයා විසින් පනවනු ලැබූ නියෝග.

ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාරවරයා.

ුග්‍රාණ්ඩුකාරවරයාගේ කාය‍්‍යාලය, කොළඹ,
966 මාර්තු 8 වැනි දින.

### නියෝග

1. මේ නියෝග 1966 අංක 3 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග නමින් හැඳින්විය හැකිය. ලුහුඬු නාමය.

2. (1) යම් හදිසි නියෝගයක, වෙනත් නිරූපණයක් පැහැදිළි ව එහි සඳහන් කොට නොමැති විටක ෙහා් අන් ලෙසකින් එහි ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වනු නො ලැබූ විටක හෝ පද සම්බන්ධයෙන් විරුද්ධ ෑර්ථයක් අවශ්‍ය නො වූ විටක— හදිසි නියෝගවල අර්ථ නිරූපණය.

යම් හදිසි නියෝගයක් සම්බන්ධයෙන් '' නීතිපති '' යන්නට උප නීතිපති, යම් නියෝජ්‍ය නීතිපතිවරයකු හෝ ඒ නියෝගයෙහි කාර්යය සඳහා ඒ වෙනුවෙන් නීතිපති විසින් බලය පවරනු ලැබූ ආණ්ඩුවේ අධිනීතිඥයකු වූ, ආණ්ඩුවේ යම් අධිනීතිඥයකු හෝ ඇතුළත් වේ ;

යම් හදිසි නියෝගයක වෙනත් අන්දමකින් විධිවිධාන සලස්වනු ලැබුවහොත් මිස, '' නියම බලධරයා '' යන්නෙන් ඒ නියෝගයෙහි කාර්යය සඳහා නියම බලධරයකු වශයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තකු අදහස් වේ ;

'' හදිසි නියෝගය '' යන්නෙන්, මේ නියෝගවලින් යමක් හෝ මහාජන ආරක්ෂක ආඥාපනත යටතේ පනවනු ලැබ එවකට බලපැවැත්වෙන අන් කිසි නියෝගයක් අදහස් වේ.

'' අත්‍යාවශ්‍ය සේවය '' යන්නෙන් මහාජන ප්‍රයෝජනය සඳහා විය යුතු ය යි හෝ මහාජන ආරක්ෂාවට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යාවශ්‍ය විය යුතු ය යි අග්‍රාණ්ඩුකාරවරයාගේ ආඥාවකින් ප්‍රකාශ කරනු ලබන යම් සේවයක් අදහස් වේ. තවද එබඳු සේවයක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ එහි ශාඛාවක්ද එයට ඇතුළත් වේ.

''පුපුරන ද්‍රව්‍යය'' යන්නෙහි පුපුරන ද්‍රව්‍ය ආඥාපනතෙහි එයට දී තිබෙන අර්ථයම ඇත්තේ ය. 183 අධි.

''ඉඩම'' යන්නෙහි ජලයෙන් වැසුණු ඉඩම් ද ගෙවල්වල හෝ ගොඩනැගිලිවල කොටස් ද ඇතුළත් වේ.

යම් දේපළක් සම්බන්ධයෙන් '' බලයෙන් ගැනීම '' යන්නෙන්, යම් දේපළක් ස්වාමිත්වයට ගැනීම හෝ බලයෙන් හිමිකර ගැනීමේ බලධරයාට කැමැත්තක් කිරීම සඳහා දේපළ භාර දෙන ලෙස නියම කිරීම අදහස් වේ. තව ද එහි ව්‍යාකරණ ප්‍රභෙද හෝ ඒකවර්ගීය පාඨ ඒ අනුව තේරුම් ගත යුතු ය.

(2) අර්ථ නිරූපණ ආඥාපනත, පනතක හෝ ආඥාපනතක අර්ථ නිරූපණය සඳහා අදාළ වන සේ ම, හදිසි නියෝගයක හෝ එය යටතේ පනවනු ලැබූ ආඥාවල හෝ ව්‍යවස්ථාවල අර්ථ නිරූපණය සඳහා ද ඒ පනත අදාළ විය යුතු ය. 2 අධි.

358/7—ආර් 12503—11,600 (66/2)

(3) යම් හදිසි නියෝගයක් පිළිබඳ ව, යම් ලේඛනයක හෝ වෙන යම් ලිඛිත නීතියක ඇති හැම සඳහනක් ම, විරුද්ධාර්ථයක් නො පෙනුණු විටක, මහාජන ආරක්ෂක පනත යටතේ සම්පාදනය කරනු ලැබ ඉන් පසු පනවනු ලැබූ නියෝගයකින් සංශෝධනය කරනු ලැබ එවකට බලපැවැත්වෙන ඒ නියෝගය සඳහන් කරනු ලැබූ ලෙස තේරුම් ගත යුතු ය.

(4) මහාජන ප්‍රයෝජනයට යම් සේවයක් විය යුතුය යි හෝ මහාජන ආරක්ෂාවට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය විය යුතු ය යි ප්‍රකාශ කෙරෙන, අග්‍ර ආණ්ඩුකාරයා විසින් මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි පනවනු ලැබූ ආඥාවක් සාමාන්‍යයෙන් මුළු දිවයින සඳහා හෝ ඒ ආඥාවෙහි නියමිත ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා කරනු ලැබිය හැකි ය.

නියම බලධරයා.

3. (1) යම් හදිසි නියෝගයක කාර්‍ය සඳහා යම් තැනැත්තකු නියම බලධරයා වශයෙන් පත් කරනු ලැබීම සාමාන්‍යයෙන් මුළු දිවයිනට ම හෝ ඒ තැනැත්තා පත් කරනු ලබන ලේඛනයෙහි නියමිත යම් ප්‍රදේශයකට හෝ ස්ථානයකට, විය හැකි ය. තව ද ඒ ලේඛනයෙහි නියමිත යම් කාර්‍යවලට ඒ පත් කිරීම සීමා කළ හැකි ය.

එසේ වුව ද, එබඳු නියෝගයක යම් කාර්‍යයක් සඳහා හෝ නියමිත ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා, නියම බලධරයන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කරනු ලැබීමට මේ ඡේදයේ පෙරාතුව වූ විධිවිධානවල කිසිවකින් අවහිර කරන ලෙස නො සැලකිය යුතු ය.

(2) නම් කරනු ලැබූ නිලයක් දරන්නකු නියම බලධරයකු ලෙස පත් කරනු ලැබූ කල්හි, විරුද්ධාකාරයට විධිවිධාන පැහැදිලි ලෙස සලස්වා නොමැති අවස්ථාවක දී, නම් කරනු ලැබූ නිලයෙහි එවකට යුතුකම් ඉටු කරන තැනැත්තා ද ඒ පත්වීමට ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය.

වාහන බලයෙන් ගැනීම.

4. (1) මහාජන ආරක්ෂාව සඳහාත්, මහාජන සාමය පවත්වා ගැනීම සඳහාත්, ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාම සඳහාත්, ලංකාවෙහි යම් වාහනයක් බලයෙන් ගැනීම අවශ්‍ය ය යි හෝ යෝග්‍ය ය යි නියම බලධරයකුට අදහස් වුවහොත්, එ බඳු වාහනයක් ඒ බලධරයාට බලයෙන් ගත හැකි ය. ඒ බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ය යි හෝ යෝග්‍ය ය යි, නියම බලධරයාට හැඟෙන, නියමයන් ඔහු විසින් කළ හැකි ය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතේ යම් වාහනයක්, නියම බලධරයා විසින් බලයෙන් ගනු ලැබූ විට, මහාජන ආරක්ෂාව සඳහාත්, මහාජන සාමය පවත්වා ගැනීම සඳහාත්, ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහාත් යෝග්‍ය ය යි, නියම බලධරයාට හැඟෙන කාර්‍යවලට හා ආකාරයට ඒ වාහනය ඔහු විසින් පාවිච්චි කළ හැකි ය. නැතහොත් යෙදිය හැකි ය. එසේ ම ඒ කාර්‍යවලට හා ආකාරයට පාවිච්චි කරන ලෙස හෝ යොදන ලෙස බලය දිය හැකි ය.

(3) මේ නියෝගයේ (1) වෙනි ඡේදයෙන් පවරනු ලැබූ බලතල ප්‍රබල ලෙස පාවිච්චි කිරීම සඳහා එසේ කිරීම අවශ්‍ය ය යි නියම බලධරයාට අදහස් වුවහොත්, මුළු ලංකාව සම්බන්ධයෙන් හෝ එහි නියමිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් හෝ කරනු ලැබූ ආඥාවකින්, ඒ ආඥාව ක්‍රියාත්මක වන අවස්ථාවෙහි, ආඥාවට සම්බන්ධ වූ ප්‍රදේශයකු, යම් භූමියක, ආඥාවෙහි විස්තර කරනු ලබන අන්දමේ වාහනයක් තම ස්වාමිත්වයෙහි හෝ තම පාලනයෙහි ඇති කිසි ම තැනැත්තකු විසින්, ආඥාවෙහි නියමිත තැනැත්තා හෝ බලධරයා විසින් ඒ වාහනය ඉවත් කිරීමට අවසර දෙන තෙක්, ඒ භූමියෙන් ඉවත් නො කරන ලෙස හෝ ඉවත් නො කර වන ලෙස හෝ එබන්දකට ඉඩ නො හරින ලෙස; නියම කළ හැකි ය.

(4) මේ නියෝගයෙහි පෙරාතුව වූ විධිවිධානවලින් යම් තැනත්තකු වෙත පවරනු ලැබූ බලතල පාවිච්චි කරනු ලැබීමෙහි දී, ඔහු විසින් ඉල්ලා සිටියහොත්, පොලිස් නිලධරයකු හෝ රජයේ වෙනත් නිලධරයකු ඔහුට ඒ සඳහා ආධාර හා සහාය දිය යුතු ය.

(5) මේ නියෝගයේ කාර්‍ය සඳහා, " නියම බලධරයා " යන්නෙන්, යුද්ධහමුදාවෙහි අණ දෙන්නා, නාවික හමුදාවේ අධිපති, ගුවන් හමුදාවේ අණ දෙන්නා, පොලිස්පති, සෑම පාලන දිස්ත්‍රික්කයක ම ආණ්ඩුවේ දිසාපති හෝ 46 වෙනි නියෝගය යටතේ යම් ප්‍රදේශයක් සඳහා පත් කරනු ලැබූ සම්බන්ධතා නිලධරයෙක් අදහස් වේ.

අසත්‍ය ප්‍රකාශ.

5. යම් තැනැත්තකු—

(අ) යම් හදිසි නියෝගයක් හෝ හදිසි නියෝගයක් යටතේ කරනු ලැබූ යම් ආඥාවක් ප්‍රකාර කරනු ලැබූ ඉල්ලීමකට පිළිතුරු වශයෙන් සැලකිය යුතු කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය බව තමා දන්නා වූ හෝ එලෙස බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතුවක් ඇත්තා වූ යම් ප්‍රකාශයක් කළහොත් හෝ එබඳු යම් තොරතුරක් සැපයුවහොත්, නැතහොත්

(ආ) යම් හදිසි නියෝගයකින් හෝ හදිසි නියෝගයක් යටතේ කරනු ලැබූ ආඥාවකින් හෝ කරන ලෙස නියම කරනු ලැබූ යම් ගිණුමක, ප්‍රකාශයක, තක්සේරුවක, වාර්තාවක හෝ අන් කිසි ලේඛනයක ඉහත සඳහන් පරිදි ප්‍රකාශයක් කළහොත්,

ඔහු වරදකට වරදකරු විය යුතු ය.

තොරතුරු ලබා ගැනීමේ හෝ භාණ්ඩයක් පරීක්ෂා කිරීමේ බලය.

6. (1) මේ නියෝගවල ඇතුළත් විශේෂ විධිවිධානවලට හානියක් නොමැතිව, නියම බලධරයා විසින් හෝ ඔහු වෙනුවෙන්, ඒ සඳහා ඉල්ලීමක් කළ විටක, මහාජන ආරක්ෂාව සඳහා හෝ මහාජන සාමය පවත්වා ගෙන යාම සඳහා හෝ හදිසි නියෝගයක කාර්‍ය සඳහා හෝ ලබා ගැනීමට හෝ පරීක්ෂා කරනු ලැබීමට, අවශ්‍ය ය යි නැතහොත් යෝග්‍ය ය යි බලධරයාට හෝ ඉල්ලීම කරන තැනැත්තාට අදහස්වන, ඉල්ලීමෙහි සඳහන් කරනු ලැබූ තොරතුරක් හා එසේ සඳහන් කරනු ලැබූ ලෙස තම ස්වාමිත්වයෙහි ඇති භාණ්ඩයක්, ඉල්ලීමෙහි සඳහන් කරනු ලැබූ ඒ බලධරයාට හෝ තැනැත්තාට යම් තැනැත්තකු විසින් සැපයිය යුතු ය. නැතහොත් ඉදිරිපත් කළ යුතු ය. තව ද මේ නියෝගය යටතේ යථා පරිදි ඔහු වෙත කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර, යම් තොරතුරක් හෝ තම ස්වාමිත්වයෙහි ඇති භාණ්ඩයක් සැපයීම හෝ ඉදිරිපත් කිරීම යම් කෙනකු පැහැර හැරිය හොත් ඔහු වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ නියෝගයෙහි '' භාණ්ඩය '' යන්නට යම් පොතක්, ගිණුමක් හෝ ලේඛනයක් ඇතුළත් වෙයි.

සෝදිසි කිරීමේ, තහනමට ගැනීමේ, සිරභාරයට ගැනීමේ හා රඳවා ගැනීමේ බලතල.

7. (1) යම් පොලිස් නිලධරයකු හෝ ලංකා යුද්ධ හමුදාවේ, ලංකා රාජකීය නාවුක හමුදාවේ හෝ ලංකා රාජකීය ගුවන් හමුදාවේ සාමාජිකයකු බන්ධනාගාර හා පරිවාස සේවා කොමසාරිස් හෝ යම් බන්ධනාගාරයක අධිකාරීවරයකු, සහකාර අධිකාරීවරයකු, ආධුනික අධිකාරීවරයකු, ජේලර් කෙනෙකු, නියෝජ්‍ය ජේලර් කෙනකු හෝ යම් බන්ධනාගාර ආරක්ෂකයකු, බන්ධනාගාර ඕවර්සියර් කෙනකු හෝ මේ නියෝගය යටතේ ක්‍රියා කිරීමට අගමැති විසින් බලය දෙනු ලැබූ අන් කිසි තැනැත්තකු විසින් හදිසි නියෝගයක් යටතේ වරදක් කරන්නා වූ නැතහොත් කරනු ලැබූ, නැතහොත් කරන ලෙස හෝ කරනු ලැබූ ලෙස සැක කරනු ලැබීමට යුක්ති සහගත හේතු ඇත්තා වූ හෝ තැනැත්තකු සෝදිසි කළ හැකි ය. එසේ සෝදිසි කිරීමේ කාර්‍ය්‍යය සඳහා එබන්දකු රඳවා ගත හැකි ය. නැතහොත් වරෙන්තුවක් නොමැති ව ඔහු සිරභාරයට ගත හැකි ය. තව ද වරද සිදු කිරීමෙහි දී හා ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ කුමන අන්දමේ හෝ යම් වාහනයක්, යාත්‍රාවක්, භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් තහනමට ගැනීම, ඉවත් කිරීම, හා රඳවා ගැනීම කළ හැකි ය.

(2) අගමැති විසින් යම් තැනැත්තකුට —

(අ) යම් භූමියකට, ස්ථානයකට, වාහනයකට හෝ යාත්‍රාවකට ඇතුළුවීමට ද, එබන්දක් සෝදිසි කිරීමට ද,

(ආ) යම් තැනැත්තකු සෝදිසි කිරීමට ද ඒ සෝදිසි කිරීම සඳහා ඔහු රඳවා ගැනීමට ද,

සෝදිසි කිරීම කරනු ලබන තැනැත්තාගේ අදහස අනුව මහාජන ආරක්ෂාව සඳහා හෝ මහාජන සාමය පවත්වාගෙන යාම සඳහා හෝ යම් හදිසි නියෝගයක කාර්‍ය්‍යය සඳහා හෝ පරීක්ෂා කිරීම හෝ භාරයට ගැනීම අවශ්‍ය වන්නා වූ කුමන අන්දමේ හෝ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් තහනමට ගැනීමට හා එබන්දක් ඉවත් කිරීමට ද ලිපියකින් බලය දිය හැකි ය.

(3) සෝදිසි කරනු ලැබූ භූමියෙහි, ස්ථානයෙහි, වාහනයෙහි හෝ යාත්‍රාවෙහි සිටි අන් කිසි තැනැත්තකුගෙන් හෝ සෝදිසි කරනු ලැබූ තැනැත්තාගෙන් සෝදිසි කිරීමේ කාර්‍ය්‍ය හා සම්බන්ධ හෝ එයට අදාළ වූ හෝ යම් කරුණක් සම්බන්ධයෙන් මේ නියෝගයේ (2) වෙනි ඡෙදය යටතේ සෝදිසියක් පවත් වන තැනැත්තකු විසින් ප්‍රශ්න කළ හැකි ය.

(4) මේ නියෝගයේ (3) වෙනි ඡෙදය යටතේ ප්‍රශ්න කරනු ලැබූ හැම තැනැත්තකු විසින් ම ප්‍රශ්න කරනු ලැබූ කරුණ සම්බන්ධයෙන් තමා දන්නා යම් තොරතුරක් සැපයිය යුතු ය.

(5) මේ නියෝගය යටතේ සෝදිසි කළ යුතු යම් භූමියක, ස්ථානයක, වාහනයක, හෝ යාත්‍රාවක පදිංචි ව සිටින නැතහොත් එබන්දක් භාර ව සිටින තැනැත්තකු විසින්, සෝදිසිය පවත් වන තැනැත්තාගේ ඉල්ලීම අනු ව එබන්දකට අවහිර නොමැති ලෙස ඔහුට ඇතුළුවීමට ඉඩ හැරීම හා එහි සෝදිසියක් කිරීම සඳහා සියලු යුක්තිසහගත පහසුකම් ඔහුට සැලසීම ද කළ යුතු ය.

(6) මේ නියෝගය යටතේ සෝදිසියක් පවත් වන තැනැත්තා විසින් සෝදිසි කළ යුතු භූමියට, ස්ථානයට, වාහනයට හෝ යාත්‍රාවට ඇතුළු වීම සඳහා යම් බාහිර හෝ අභ්‍යාන්තර දොරක් හෝ ජනේලයක් විවෘත කළ හැකි ය. නැතහොත් කඩා විවෘත කළ හැකි ය.

(7) ස්ත්‍රියක සෝදිසි කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක සෝදිසිය අන් කිසි ස්ත්‍රියක විසින් කළ යුතු ය.

(8) (අ) මේ නියෝගය යටතේ සිරභාරයට ගනු ලැබූ යම් තැනැත්තකු සිරභාරයට ගත් ස්ථානයේ සිට ලංකාවේ කවර තැනක වුව ද පිහිටි අන් කිසි ස්ථානයකට ගෙන ගොස් සිරභාරයයෙහි රඳවා ගත හැකි ය.

(ආ) යමකු සිරභාරයට ගැනීම පිණිස මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදයෙන් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට මේ ඡෙදයෙහි (ආ) අනුච්ඡෙදය මගින් පවරනු ලැබූ බලය ක්‍රියාවේ යෙදීමේ හා සන්නද්ධ බලය ඇතුළු ව, මේ කාර්‍ය්‍යය සඳහා අවශ්‍ය විය හැකි අන්දමේ සෑම බලයක් ම පාවිච්චි කිරීමේ අයිතිය හිමි විය යුතුය.

(ඇ) මේ ඡෙදයෙහි (අ) අනුච්ඡෙදයේ විධිවිධාන අනු ව රඳවා ගනු ලැබූ යම් තැනැත්තකු නීත්‍යානුකූල සිරභාරයෙහි සිටින ලෙස සැලකිය යුතු අතර පොලිස් පති විසින් බලය පවරනු ලබන අන්දමේ ස්ථානයක, ඔහු විසින් නිකුත් කරනු ලැබූ උපදෙස් අනු ව, ඒ තැනැත්තා රඳවා ගත යුතු ය. තව ද ඒ ස්ථානය බන්ධනාගාර ආඥපනත යටතේ පිහිටුවනු ලැබූ බන්ධනාගාරයක් වන අවස්ථාවක, ඒ තැනැත්තා භාර ගෙන ඔහු රඳවා ගැනීම ඒ බන්ධනාගාරය භාර ව සිටින නිලධාරියාගේ යුතුකම විය යුතු ය. 54 අධි.

දැන්වීම් භාර දීම.

8. යම් හදිසි නියෝගයක ඇතුළත් කරනු ලැබූ යම් විශේෂ විධිවිධානවලට හානියක් නොමැති ව, යම් හදිසි නියෝගයක කාර්‍ය්‍යය සඳහා යම් තැනැත්තකු වෙත භාර දිය යුතු දැන්වීමක්, ඒ තැනැත්තාගේ අන්තිම හෝ සිරිත් පරිදි වූ වාසස්ථානය, හෝ ව්‍යාපාරික ස්ථානය වෙත ලියුමක මාර්ගයෙන් තැපැලෙන් යැවීමෙන් භාර දිය හැකි ය.

ආඥා ආදිය අවලංගු කිරීම හ වෙනස් කිරීම.

9. යම් ආඥාවක් හෝ ව්‍යවස්ථා පැනවීම සඳහා යම් හදිසි නියෝගයකින් පැවරුණු යම් බලයක, ඒ ආකාරයට හා යම් කොන්දේසි වෙතහොත්, ඒ කොන්දේසි වලට යටත් ව, ආඥාව හෝ ව්‍යවස්ථා අවලංගු කිරීම හෝ වෙනස් කිරීම සඳහා පාවිච්චි කළ හැකි බලයක් ඇතුළත් වූ ලෙස තේරුම් ගත යුතු ය.

අග්‍රාණ්ඩුකාරවරයාගේ බලතල.

10. වෙනත් ආකාරයකට පැහැදිළි ව ම විධිවිධාන සලස්වනු ලැබූ විටක හැර, යම් හදිසි න්යෝගයක් මගින් පවරනු ලැබූ බලතල, අග්‍රාණ්ඩුකාරවරයා වෙත හෝ වෙනත් බලධරයකු හෝ තැනැත්තකු වෙත නීති මගින් පවරනු ලැබූ වෙනත් යම් අයිතිවාසිකම් හා බලතල හීන කිරීම සඳහා නොව ඊට අත්රේක ව විය යුතු ය.

ඇඳිරි නීතිය.

11. (1) ආඥාවෙන් හෝ මේ නියෝගය යටතේ අනතුරුව පනවනු ලබන ආඥාවකින් කළ හැකි එබඳු නිදහස් කිරීම්වලට යටත් ව, එම ආඥාවේ නියමිත පැය ගණන අතර හෝ කාලසීමාව ඇතුළත යම් ප්‍රදේශයක කිසි යම් තැනැත්තකු, ආඥාවේ ම නියමිත එබඳු තැනැත්තකු විසින් දෙනු ලැබූ ලිඛිත අවසර පත්‍රයක බලය

යටතේ මිස, ප්‍රසිද්ධ මාර්ගයක, දුම්රිය මාර්ගයක, ප්‍රසිද්ධ උද්‍යානයක, මහජන විනෝද ක්‍රීඩා සමාජ භූමියක, වෙනත් ප්‍රසිද්ධ භූමියක, මුහුදු වෙරළෙහි හෝ ආඥාවෙහි නියමිත අන් කිසි ගොඩනැගිල්ලක, භූමියක හෝ ස්ථානයක නො සිටිය යුතු යයි අගමැති විසින් ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් ආඥාවක් මගින් නියම කළ හැකි ය.

(2) මේ නියෝගයේ (1) වෙනි ඡේදයේ "ප්‍රසිද්ධ මාර්ගය" යන්නට ප්‍රසිද්ධ මාර්ගයට අයිති වන හෝ සම්බන්ධ වන ප්‍රසිද්ධ පාලමකට උඩින් වූ පාරක්, යම් පදික වේදිකාවක්, කාණුවක්, කණ්ඩියක් හෝ අගලක් ඇතුළත් වේ.

පෙරහැරවල් හා රැස්වීම් තහනම් කිරීම.

12. (1) ආඥාවෙන් හෝ මේ නියෝගය යටතේ අනතුරු ව පන වනු ලබන යම් ආඥාවකින් කරනු ලබන යම් නිදහස් කිරීම්වලට යටත් ව, ආඥාවේ නියම කරනු ලබන එබඳු කාල සීමාවකට ලංකාවෙහි නියමිත යම් ප්‍රදේශයක ප්‍රසිද්ධ පෙරහැරවල්, මහාජන රැස්වීම් හෝ ඒ පන්තියේ පෙරහැරවල් හෝ රැස්වීම් පැවැත්වීම ආඥාවක් මගින් අගමැති විසින් තහනම් කළ හැකි ය.

(2) අගමැතිගේ අදහස අනුව, මහාජන සාමයට බාධාවක් හෝ බලවත් කළකිරීමක් ඇති කළ හැකි යම් පෙරහැරක් හෝ රැස්වීමක් ලංකාවෙහි යම් ප්‍රදේශයක පැවැත්වීම තහනම් කරන නියමයන් අගමැති විසින් කළ හැකි ය.

(3) මේ නියෝගය යටතේ කරනු ලැබූ යම් ආඥාවක් හෝ දෙනු ලැබූ යම් නියමයන් ඉෂ්ට කරවීම සඳහා යුක්ති සහගත ව අවශ්‍ය විය හැකි පරිදි කටයුතු කිරීම හෝ එසේ බලය පාවිච්චි කිරීම යම් පොලිස් නිලධරයකු විසින් කළ හැකි ය.

අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාම, එයට බාධා කිරීම ආදිය.

13. (1) අග්‍රාණ්ඩුකාරවරයා විසින් 2 වන නියෝගය යටතේ පනවනු ලැබූ ආඥාවක් මගින් යම් සේවයක් අත්‍යවශ්‍ය සේවයක් යයි ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක, 1966 මාර්තු 7 වන දින හෝ ඉන් පසු ඒ සේවයට සම්බන්ධ යම් කාර්යයක නියුක්තව සිටි හෝ සේවයෙහි යොදවනු ලැබූ යම් තැනැත්තකු ඒ ආඥාවේ දිනයෙහි සිට එක් දිනයක් ඉකුත් වීමෙන් පසු, තමා වැඩ කරන හෝ සේවයෙහි යෙදී සිටින ස්ථානයට හෝ තම සේවා යෝජකයා විසින් හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් කලින් කල නම් කරනු ලබන වෙනත් ස්ථානයකට පැමිණ සිටීම පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ ඒ ආඥාවේ දිනයේ සිට එක් දිනයක් ඉකුත්වීමෙන් පසු, තම සේවා යෝජකයා විසින් හෝ ඔහුගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් ඉටු කරන ලෙස තමාට නියම කරනු ලබන එබඳු කාර්යයන් පැහැර හැරියහොත් හෝ ඉටු කිරීම ප්‍රතික්ෂේප කළහොත්, වැඩ වර්ජනයකට අනුබල දීමක් වශයෙන් එසේ පැමිණීම හෝ එසේ වැඩ කිරීම පැහැර හැරිය හෝ ප්‍රතික්ෂේප කළ නමුත්, ඔහු—

(අ) අන් කිසි නීතියක හෝ ඔහුගේ සේවය පිළිබඳ වූ යම් ගිවිසුමක නියමවල හෝ කොන්දේසිවල පටහැනිව කුමක් සඳහන් වුව ද, සියලු කාර්යයන් සඳහා ඔහු එකෙනෙහිම තම සේවය අවසන් කළ ලෙස හෝ ඉන් ඉවත් වූ ලෙස සැලකිය යුතු ය ;

(ආ) තවද ඊට අතිරේකව වරදකට වරදකරු ද විය යුතු ය.

(2) අග්‍රාණ්ඩුකාරවරයා විසින් 2 වෙනි නියෝගය යටතේ පනවනු ලැබූ ආඥාවක් මගින් යම් සේවයක් අත්‍යවශ්‍ය සේවයක් යයි ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක—

(අ) යම් තැනැත්තකු, කවර ආකාරයකින් හෝ,

(i) ඒ සේවය පවත්වාගෙන යාමට බාධා කළහොත්, අවහිර කළහොත්, එය ප්‍රමාද කළහොත් හෝ සීමා කළහොත් හෝ,

(ii) ඒ සේවය පවත්වාගෙන යාමෙහි හෝ ඒ සම්බන්ධයෙන් සේවයෙහි යොදවනු ලබන අන් කිසි තැනැත්තකුට ඔහු වැඩ කරන තැනට නො පැමිණ සිටින ලෙස බාධා කළහොත්, අවහිර කළහොත්, වළක්වත හොත්, හෝ

(iii) යම් සේවයක සේවයෙහි යොදවනු ලැබූ හෝ එය කර ගෙනයාම් සඳහා සේවයෙහි යොදවනු ලැබූ යම් තැනැත්තකුට ඔහු වැඩ කරන තැනට නො පැමිණෙන ලෙස පෙළඹුවහොත්, උනන්දු කළහොත්, හෝ දිරිගැන්වුවහොත්, හෝ

(iv) රජයේ දෙපාර්තමේන්තුවක් හෝ එහි අංශයක් වන සේවයක් වෙනුවට හෝ ඒ හා සමාන්තරව යම් සේවයක් පිහිටු වීමට හෝ පවත්වාගෙන යාමට බල කළහොත්, පෙළඹුවහොත්, උනන්දු කළහොත්, හෝ දිරිගැන්වුවහොත්, හෝ

(v) යම් සේවයක සේවයෙහි යොදවනු ලැබූ හෝ එය කරගෙන යාම සඳහා සේවයෙහි යොදවනු ලැබූ යම් තැනැත්තකුට ඒ සේවය පාවා දීමට, ඉන් ඉවත් වී යාමට (එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ අන් තැනැත්තා එසේ පාවා දුන්නත්, නැතත් හෝ ඉවත්ව යතත්, නැතත්) බල කළහොත්, පෙළඹුවහොත්, උනන්දු කළහොත් හෝ දිරිගැන්වුව හොත්, හෝ

(vi) ඒ සේවයෙහි හෝ ඒ සේවය ගෙන යාම සම්බන්ධයෙන් වෙන යම් තැනැත්තකු රක්ෂා ලබා දීම හෝ බාර ගැනීම වැළැක්වුවහොත්, හෝ

(ආ) යම් තැනැත්තකු යම් කායික ක්‍රියාවකින් හෝ යම් කථාවකින් හෝ ලියවිල්ලකින් මේ ඡේදයෙහි (අ) අනුච්ඡේදයෙන් නියම කරනු ලැබූ යම් ක්‍රියාවක් කරන ලෙස (එහි ප්‍රතිඵලයක් ලෙස ඒ අනෙක් තැනැත්තා එසේ නියමිත යම් ක්‍රියාවක් කළත්, නොකළත්) අන් කිසි තැනැත්තකු පෙළඹුවහොත්, උනන්දු කළහොත් හෝ දිරිගැන්වුවහොත්,

ඔහු වරදකට වරදකරු විය යුතුය.

(3) මේ නියෝගයට විරුද්ධ යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, ඒ වරද සඳහා අධිකරණය විසින් නියම කළයුතු වෙන යම් දඬුවමකට අතිරේක වශයෙන්—

(අ) ඒ තැනැත්තාගේ සියලුම නිශ්චල හෝ චංචල දේපළ ඒ වරදකරු කිරීම ප්‍රකාර මහරජිනට රාජසන්තක වන බව සැලකිය යුතු ය. එසේ ම,

(ආ) මේ නියෝග ක්‍රියාත්මක වීමේ දිනයෙන් පසු ඒ තැනැත්තා විසින් ඒ දේපළ සම්බන්ධයෙන් කරනු ලැබූ යම් අන් සතු කිරීමක් හෝ වෙන යමක් කිරීමක් ශූන්‍ය හා බලරහිත වන ලෙස සැලකිය යුතු ය.

වැලිෆෝන් පහසුකම් සීමා කිරීම.

14. (1) (අ) ටැලිෆෝන් පහසුකම් පවත්වා ගෙන යාමට අවශ්‍ය පුද්ගලයන් නොමැතිකම හෝ වෙනත් යම් කරුණක් නිසා රජයට අයති හෝ රජය විසින් පවත්වා ගෙන යන උපකරණ මාර්ගයෙන් ක්‍රියා කරනු ලබන ටැලිෆෝන් මගින් කරනු ලබන පණිවුඩ හුවමාරුව සඳහා ඇති පහසුකම් සීමාවන යම් අවස්ථාවක, හා

(ආ) එසේ ඇති එබඳු පහසුකම් හැකිතාක් දුරට යම් අත්‍යවශ්‍ය පණිවුඩ හුවමාරු කිරීමේ කාර්‍ය්‍යයන් සඳහා පමණක් යෙදවීමට වග බලා ගැනීම අවශ්‍ය බව විදුලි සන්දේශ අධ්‍යක්ෂගේ මතය වන යම් අවස්ථාවක,

ස්වකීය මතය පරිදි යම් අත්‍යවශ්‍ය පණිවුඩයක් හුවමාරු කිරීමේ කාර්‍ය්‍යය සඳහා අවශ්‍ය නො වන යම් ටැලිෆෝනයක් පාවිච්චි කිරීම වැළැක්වීමේ කාර්‍ය්‍යය සඳහා අධ්‍යක්ෂ විසින් ටැලිෆෝන් පහසුකම් ආපසු ගැනීම හෝ නතර කිරීම හෝ අවශ්‍ය ය යි තමාට පෙනී යන එබඳු වෙනත් කටයුතු සැලසීම හෝ සලස්වනු ලැබීම කළ හැකි ය.

මේ ඡෙදයේ '' අවශ්‍ය පණිවුඩ හුවමාරු කිරීම '' යන්නෙන් මහාජන සාමය පවත්වා ගෙන යාම හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාම සම්බන්ධ හෝ ඊට ආනුෂංගික වූ කාර්‍ය්‍යයන් සඳහා අවශ්‍ය යම් පණිවුඩ හුවමාරුවක් අදහස් වේ.

(2) (අ) මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය පවත්වා ගෙන යාමට හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාමට හෝ හානි පමුණුවන යම් ආකාරයකින් ක්‍රියා කිරීමෙන් ; හෝ

(ආ) යම් හදිසි නියෝගයක් යටතේ තහනම් කරනු ලැබූ සංවිධානයක් ය යි ප්‍රකාශ කරනු ලබන යම් සංවිධානයක ප්‍රතිපත්තිය හෝ පරමාර්ථ හෝ අරමුණු වර්ධනය කිරීමේ කාර්‍ය්‍යය සඳහා යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමෙන් හෝ එබන්දක් නො කර හැරීමෙන් ; හෝ

(ඇ) යම් හදිසි නියෝගයක් කඩ කරමින් ක්‍රියා කරන ලෙස තැනැත්තන් පෙළඹවීමෙන්, ඔවුන්ට ආධාර දීමෙන් හෝ සහාය වීමෙන්,

යම් තැනැත්තකු වැළැක්වීමේ අදහසින්, ඒ තැනැත්තාට සපයනු ලැබූ යම් ටැලිෆෝන් පහසුකම් ආපසු ගනු ලැබීම අවශ්‍ය ය යි පොලිස්පතිගේ මතය වන අවස්ථාවක, එසේ කරන ලෙස විදුලි සන්දේශ අධ්‍යක්ෂගෙන් ඉල්ලා සිටීම ඔහු විසින් ම කළ හැකි අතර එසේ ඉල්ලා සිටීමේ දී ඒ විදුලි සන්දේශ අධිකාරී විසින් සියලු ම ටැලිෆෝන් පහසුකම් ඒ තැනැත්තාගෙන් ආපසු ලබාගත යුතුය.

(3) ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් විටින් විට නිශ්චය කරනු ලබන එ බඳු යම් කාල සීමාවක් තුළ, ඔහු විසින් නිශ්චය කරනු ලැබිය හැකි අන්දමේ ස්ථාන අතර, ඒ ස්ථාන එක ම පළාතක පිහිටා ඇතත් නැතත්, ඔහු විසින් අනුමත කරනු ලැබූ කාර්‍ය්‍යයක් සඳහා හැර අන් කිසි කාර්‍ය්‍යයක් සඳහා, විදුලි මගින් හෝ ටෙලිෆෝන් මගින් පණිවුඩ හුවමාරු කිරීම නො තිබිය යුතු ය.

(4) යම් ටැලිෆෝන් යන්ත්‍ර ස්ථානයක් කුලියට දීම හෝ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අදළ යම් ගිවිසුමක කුමක් සඳහන් වුව ද, මේ නියෝගයෙන් පවරනු ලැබූ බලතල අනු ව කරනු ලැබූ යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධ අලාභවලට හෝ දූරීමට සිදු වූ වෙන යම් ඕනෑ ම වගකීමකට රජය හෝ විදුලි සන්දේශ අධිකාරී හෝ ඔහුගේ බලය යටතේ වූ යම් නිලධරයකු යටත් නො විය යුතු ය.

විදුලි පණිවුඩ හා ගුවන් විදුලි පණිවුඩ සීමා කිරීම.

15. (1) ආඥාවෙහි නියමිත ප්‍රදේශයෙහි ඇතුළත හෝ පිටත පණිවුඩ යැවීම සඳහා හෝ ඒ ප්‍රදේශය ඇතුළතින් හෝ පිටතින් එවනු ලැබූ පණිවුඩ ලබා ගැනීම සඳහා හෝ ඒ ප්‍රදේශයෙහි හෝ ආඥාවෙහි නියම කරනු ලැබූ ඒ ප්‍රදේශයෙහි යම් ස්ථානයක පිහිටුවනු ලැබූ හෝ ස්ථාපනය කරනු ලැබූ යම් විදුලි පණිවුඩ ක්‍රමයක් හෝ යම් ගුවන් විදුලි පණිවුඩ ක්‍රමයක් ආඥාවකින් අගමැති විසින් නියමිත යම් ප්‍රදේශයක කිසි ම තැනැත්තකු විසින් පාවිච්චි නො කළ යුතු ය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදයේ කාර්‍ය්‍ය සඳහා '' විදුලි පණිවුඩ '' හා '' ගුවන් විදුලි පණිවුඩ '' යන පාඨයන්ට විදුලි සන්දේශ ආඥාපනතෙහි පිළිවෙළින් දී තිබෙන අර්ථයන් ම ඇති විය යුතු ය. අධි. 192.

ලංකාවට නීති විරෝධි ලෙස ඇතුළුවීම.

16. (1) යම් තැනැත්තකු —

(අ) ආගමන හා විගමන පනතෙහි හෝ එය යටතේ සම්පාදිත ආඥාවක හෝ නියෝගයක යම් විධිවිධානයකට පට හැනි ව ලංකාවට ඇතුළුවත හොත්, හෝ

351 අධි.

(ආ) ඒ පනතෙහි හෝ ඒ ආඥාවෙහි හෝ ඒ නියෝගයෙහි යම් විධිවිධානයකට පටහැනි ව කිනම් ආකාරයකින් වුවද ලංකාවට යම් තැනැත්තකු ගෙන එතහොත්,

වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදයේ (අ) අනුච්ඡෙදය යටතේ යම් වරදකට යම් තැනැත්තකුට විරුද්ධ ව නඩු පැවරීමක දී, ආගමන හා විගමන පනතෙහි හෝ එය යටතේ සම්පාදිත ආඥාවක හෝ නියෝගයක යම් විධානයකට පටහැනි ව ලංකාවට ඇතුළු වූ තැනැත්තකු බව තමා විශ්වාස කරන බවට සහකාර අධිකාරිවරයකුගේ තත්ත්වයට පහළ තත්ත්වයක නොවන පොලිස් නිලධරයකු විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කළහොත්— 351 අධි.

(අ) ඔහු, ඒ පනතෙහි III වෙනි කොටස අදළ නොවන තැනැත්තකු බව, හෝ

(ආ) ඒ විධිවිධානයක් ප්‍රකාර ඔහු ලංකාවට ඇතුළු වූ බව, හෝ

(ඇ) ඒ පනතෙහි අර්ථය ඇතුළත නියමිත දිනයට පෙර ඔහු ලංකාවේ සිටි බව හා ඉන් පසු ලංකාව අත්හැර නොගිය බව, හෝ

(ඈ) ඒ දිනයෙහි හෝ ඉන් පසු ලංකාවෙහි දී උපන් බව හා ඉන් පසු ලංකාව අත්හැර නො ගිය බව,

ඔහු විසින් ඔප්පු කළහොත් විනා, ඒ විධිවිධානයට පටහැනි ව ඒ තැනැත්තා ලංකාවට ඇතුළු වූ ලෙස පූර්ව නිගමනය කළ යුතු ය.

(3) මේ නියෝගයේ (ආ) අනුච්ඡේදය යටතේ යම් වරදකට නඩු පැවරීමේ දී, ආගමන හා විගමන පනතෙහි හෝ එය යටතේ පනවන ආඥාවක හෝ නියෝගයක යම් විධිවිධානයකට පටහැනි ව සහතිකයෙහි නම් කරනු ලැබූ තැනැත්තා ලංකාවට ඇතුළු වූ බව තමා විශ්වාස කරන බවට සහකාර අධිකාරී වරයකුගේ තත්ත්වයට පහළ තත්ත්වයක නොවන පොලිස් නිලධරයකු විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඉදිරිපත් කරනු ලැබුවහොත්—

(අ) එසේ නම් කරනු ලැබූ තැනැත්තා ඒ පනතෙහි III වෙනි කොටස අදළ නොවන තැනැත්තකු බව, හෝ

(ආ) ඒ විධිවිධානයක් ප්‍රකාර ඔහු ලංකාවට ඇතුළු වූ බව, හෝ

(ඇ) ඒ පනතෙහි අර්ථය ඇතුළත නියමිත දිනයට පෙර ඔහු ලංකාවේ සිටි බව හා ඉන් පසු ලංකාව අත්හැර නො ගිය බව, හෝ

(ඈ) ඒ දිනයෙහි හෝ ඉන්පසු ලංකාවෙහි දී උපන් බව හා ඉන් පසු ලංකාව අත්හැර නො ගිය බව,

විත්තිකරු විසින් ඔප්පු කළහොත් විනා, සහතිකයෙහි නම් කරනු ලැබූ තැනැත්තා ඒ විධිවිධානයට පටහැනි ව ලංකාවට ඇතුළු වූ ලෙස පූර්ව නිගමනය කළ යුතු ය.

(4) මේ නියෝගයෙහි පෙරාතුව වූ විධිවිධාන ආගමන හා විගමන පනතෙහි විධිවිධානවලට අතිරේකව මිස, එහි බලය අඩු කිරීම් වශයෙන් නො විය යුතු ය.

පුද්ගලික සේවාවන් බලයෙන් ගැනීම

17. මහාජන ආරක්ෂාව පවත්වාගෙන යාම හෝ අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා ආධාර වශයෙන් හෝ ඒ සම්බන්ධයෙන් යම් වැඩක් කිරීමට හෝ පුද්ගලික සේවයක් කිරීමට ස්වකීය අත්සන යටතේ ආඥාවකින් යම් තැනැත්තකුට නියම කිරීම, හෝ ඒ ආකාරයෙන් නියම කිරීමට ඒ වෙනුවෙන් නියමිත බලධරයන් හෝ නිලධරයන් එක්කෙනකුට හෝ ඊට වැඩි දෙනකුට බලය පැවරීම අගමැති විසින් කළ හැකි ය.

අප්‍රසාදය වැළැක්වීම.

18. කිසිම තැනැත්තකු විසින්—

(අ) (i) රජයේ සේවකයන් වූ,

(ii) මහාරාජිණියගේ සේවයෙහි නියුක්ත, හෝ

(iii) අත්‍යාවශ්‍ය සේවාවන් ඉටු කිරීමෙහි නියුක්තවූ,

තැනැත්තන් අතර අප්‍රසාදය ඇති කිරීමට උත්සාහ කිරීම ;

(ආ) (අ) ඡෙදයෙහි සඳහන් කරනු ලැබූ යම් තැනැත්තකු රජයේ සේවකයකු වශයෙන් හෝ අවස්ථාව පරිදි එ ලෙස නියුක්ත වූ තැනැත්තකු වශයෙන් හෝ තම යුතුකම කඩ කරනු වස් යමක් කිරීමට හෝ යමක් නො කොට පැහැර හැරීමට හෝ පෙළඹවීමට උත්සාහ කිරීම ;

(ඇ) (අ) අනුච්ඡේදය හෝ (ආ) අනුච්ඡේදය උල්ලංඝනය කිරීමේ අදහසින් හෝ උල්ලංඝනය කිරීමට සහාය වීම, අනුබල දීම, උපදෙස් දීම සඳහා හෝ ඉහත කී තැනැත්තන් අතර පිටපත් විසුරුවා හැරීමෙන් එබඳු උල්ලංඝනය කිරීමක් සංගෘහිත වන ස්වභාවයකින් යුත් යම් ලේඛනයක් තම ස්වාමීත්වය හෝ තම පාලනය යටතේ තබා ගැනීම,

නො කළ යුතු ය.

රාජ්‍ය භෙදය හා පෙළඹවීම.

19. කථිත හෝ ලිඛිත වචනවලින්, හෝ සලකුණුවලින් හෝ දෘශ්‍ය නිරූපණවලින්, හෝ හැසිරීමෙන් හෝ අන් කිසි ක්‍රියාවකින්—

(අ) රැජිණ හෝ ආණ්ඩුව ද්වේෂයට හෝ අපහාසයට ලක් කරන හෝ ලක් කිරීමට තැත් කරන, හෝ රැජිණ හෝ රජය කෙරෙහි අප්‍රසාදත්මක හෝ ද්වේෂසහගත හෝ අපහාසාත්මක හැඟීම් අවුස්සන හෝ පොළඹවන, හෝ එ බඳු හැඟීම් ඇවිස්සීමට හෝ පොළඹවීමට තැත් කරන ; හෝ

(ආ) ලංකාවේ ආණ්ඩු ක්‍රමය හෝ අධිකරණ පාලනය ද්වේෂයට හෝ අපහාසයට ලක් කරන හෝ ලක් කිරීමට තැත් කරන, හෝ ලංකාවේ ආණ්ඩු ක්‍රමය කෙරෙහි හෝ අධිකරණ පාලනය කෙරෙහි ද්වේෂසහගත හෝ අපහාසාත්මක හැඟීම් අවුස්සන හෝ පොළඹවන හෝ එබඳු හැඟීම් ඇවිස්සීමට හෝ පෙළඹවීමට තැත් කරන ; හෝ

(ඇ) නීති මගින් ප්‍රතිෂ්ඨාපිත යම් කරුණක් නීත්‍යනුකූල මාර්ගයකින් හැර අන් ලෙසකින් වෙනස් කර ගන්නා ලෙස ලංකාවේ වැසියන් හෝ ඔවුන් අතුරෙන් යම් කොටසක්, පන්තියක් හෝ සමූහයක් අවුස්සන හෝ පොළඹවන හෝ ඇවිස්සීමට හෝ පෙළඹවීමට තැත් කරන ; හෝ

(ඈ) ලංකාවේ වැසියන් අතර හෝ ඔවුන්ගේ යම් කොටසක්, පන්තියක් හෝ සමූහයක් අතර අතෘප්තිය හෝ අප්‍රසාදය පහළ කරවන හෝ ඇති කරවන හෝ පහළ කරවීමට හෝ ඇති කරවීමට තැත් කරන ; හෝ

(ඉ) ලංකාවේ වැසියන්ගේ විවිධ කොටස්, පන්ති හෝ සමූහයන් අතර ද්වේෂසහගත හෝ විරුද්ධ හැඟීම් දියුණු කරන හෝ පෝෂණය කරන හෝ දියුණු කිරීමට හෝ පෝෂණය කිරීමට තැත් කරන ; හෝ

(ඊ) නීති මගින් ප්‍රතිෂ්ඨාපිත යම් කරුණක් වෙනස් කරන ලෙස හෝ යම් ක්‍රියාවක් හෝ දෙයක් කරන ලෙස හෝ කිරීමෙන් වැළකී සිටින ලෙස පාර්ලිමේන්තුව හෝ රජය පෙළඹවීමේ හෝ පාර්ලිමේන්තුවට හෝ ආණ්ඩුවට බල කිරීමේ කාර්‍ය්‍ය සඳහා යම් ආකාරයක කායික බලහත්කාරය හෝ සාහසිකත්වය, සාමය කඩ කිරීම, නීතියට අකීකරුවීම හෝ නීතිය ක්‍රියාවේ යෙදීමට බාධා කිරීම යොදවන ලෙස ලංකාවේ වැසියන් හෝ ඔවුන් අතුරෙන් යම් කොටසක්, පන්තියක් හෝ සමූහයක් අවුස්සන හෝ පොළඹවන හෝ ඇවිස්සීමට හෝ පොළඹවීමට තැත් කරන ; හෝ

(උ) තම නීත්‍යානුකූල බලතල හෝ කාර්‍ය ක්‍රියාවේ යොදවන ලෙස හෝ එසේ කිරීමෙන් වැළකී සිටින ලෙස ඔහු පෙළඹවීමේ හෝ ඔහුට බල කිරීමේ චේතනාවෙන්, අග්‍රාණ්ඩුකාරවරයාට හෝ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හෝ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යම් මන්ත්‍රීවරයකුට, හෝ රජයේ යම් සේවකයකුට අඩන්තේට්ටම් කරන හෝ එබන්දකු අයුතු ලෙස වළක්වන, හෝ අයුතු ලෙස වැළැක්වීමට තැත් කරන, හෝ කායික බලහත්කාරයෙන් හෝ එය පෙන්වීමෙන් හෝ ඒ පිළිබඳ තර්ජනයෙන් බිය ගන්වන, හෝ එසේ බිය ගැන්වීමට තැත් කරන ;

(ඌ) යම් හදිසි නියෝගයක් කඩ කිරීමක් සංගෘහිත වන යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමට හෝ නො කර හැරීමට ලංකාවේ වැසියන් හෝ ඔවුන් අතරෙන් යම් කොටසක්, පන්තියක්, හෝ සමූහයක් අවුස්සන හෝ පොළඹවන හෝ ඇවිස්සීමට හෝ පෙළඹවීමට තැත් කරන ;

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර යටත් පිරිසෙයින් තුන් මාසය දක්වා දීර්ඝ විය යුතු වූත් අවුරුදු විස්සට වඩා දීර්ඝ නොවිය යුතු වූත්, බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් ලැබිය යුතුවාක් මෙන් ම, දඩයකට ද යටත් කළ හැකි ය.

20. (1) මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය රැකීමට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යාවශ්‍ය වූ සැපයීම් හා සේවාවන් පවත්වා ගෙන යාමට හානිකර වන හෝ හානිකර විය හැකි කරුණු හෝ කෙළින් ම හෝ මහාජනයාහට හෝ ඔවුන් අතුරෙන් යම් කොටසකට පීඩා පැමිණවීමෙන් හෝ රජයට බලහත්කාරකම් පෑමට අදහස් කරනු ලැබූ යම් ක්‍රියාවක් කරන ලෙස තැනැත්තන් පොළඹවන හෝ උනන්දු කරවන කරුණු ලංකාවෙහි හෝ ලංකාවෙහි යම් නියමිත ප්‍රදේශයක ප්‍රසිද්ධ කිරීම හෝ ලංකාවේ සිට ලංකාවෙන් බැහැර ස්ථාන වලට යැවීම වැළැක්වීම සඳහා හෝ සීමා කිරීම සඳහා අවශ්‍ය ය යි තමාට අදහස් විය හැකි අන්දමේ විධිවිධාන යෙදීම හා නියමයන් කිරීම නියම බලධරයකු විසින් කළ හැකි ය. තවද, ලේඛන, චිත්‍ර නිරූපණ, ඡායාරූප හෝ සිනමා චිත්‍රපටි, ප්‍රසිද්ධ කරනු ලැබීමට පෙර, නියම බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ; නැතහොත් ප්‍රදර්ශනය කළ යුතු ය යන්න ඇතුළත් ව අවශ්‍ය ලෙස හෝ අවස්ථානුකූල ලෙස නියම බලධරයාට වැටහෙන අන්දමේ ආනුෂංගික හෝ අතිරේක විධිවිධාන මේ ඡේදය යටතේ වූ නියම යන්ට ඇතුළත් විය හැකි ය. ප්‍රකාශන පාලනය කිරීම.

(2) මේ නියෝගයේ (1) වෙනි ඡේදය යටතේ යම් නියමයන්හි විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු ය ; තව ද පුවත් පතක් පළ කිරීමේ හේතුවෙන් යම් තැනැත්තකු එබඳු වරදකට වරදකරුවුවහොත්, ආඥාවෙහි නියම කරනු ලබන ප්‍රමාණයේ කාල සීමාවක් තුළ, ඒ තැනැත්තා විසින් ලංකාවෙහි කිසි ම පුවත් පතක් පළ නොකළ යුතු ය යි අගමැති විසින් ආඥාවකින් නියම කළ හැකි ය.

(3) ස්වකීය මතය පරිදි, මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය රැකීමට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යාවශ්‍ය වූ සැපයීම් හා සේවාවන් පවත්වා ගෙන යාමට හානිකර වන සේ අදහස් කරනු ලැබූ කරුණු, හෝ කෙළින් ම හෝ මහාජනයාට හෝ ඔවුන් අතුරෙන් යම් කොටසකට පීඩා පැමිණවීමෙන් රජයට බලහත්කාරකම් පෑමට අදහස් කරනු ලැබූ ක්‍රියාවක් කරන ලෙස තැනැත්තන් පොළඹවන හෝ උනන්දු කරවන කරුණු, යම් පුවත් පතක පළ කරනු ලැබේ ය යි හෝ පළකරනු ලැබුවේ ය යි නියම බලධරයකු ගේ අදහස වුවහොත්, ඔහු විසින් ආඥාවක මාර්ගයෙන් මේ නියෝගයේ විධිවිධාන ඒ පුවත්පතට අදාළ කළ හැකි ය.

(4) නියම බලධරයකු විසින්, යම් ආඥාවක නමින් සඳහන් කොට ඇති යම් පුවත් පතකට මේ නියෝගයේ විධිවිධාන ඒ ආඥාවේ මාර්ගයෙන් අදාළ කරනු ලැබූ අවස්ථාවක, ඒ නමින් පළ කරනු ලබන යම් පුවත් පතකට පමණක් නොව, අන් කිසි නමකින් පළ කරනු ලබන යම් පුවත් පත්වලට ද ඒ විධිවිධාන අදාළ විය යුතු ය. එසේ වන්නේ ඒ පුවත් පත් පළ කිරීම කිසි යම් අන්දමකින් ආඥාවෙහි නියමිත පුවත් පත් පළ කිරීම අඛණ්ඩ ව පැවැත්වීමක් හෝ එය වෙනුවට ආදේශ කිරීමක් වුවහොත් ය.

(5) ආඥාවෙන් මේ නියෝගයෙහි විධිවිධාන අදාළ කරවනු ලැබූ යම් පුවත් පතක් මුද්‍රණය කිරීම, පළ කිරීම හෝ බෙද හැරීම, කිසි ම තැනැත්තකු විසින් නො කළ යුතු ය. නැතහොත් ආඥාවෙන් මේ නියෝගයෙහි විධිවිධාන අදාළ කරවනු ලැබූ යම් පුවත් පතක් මුද්‍රණය කිරීමට, පළ කිරීමට හෝ බෙද හැරීමට කිසි ම අන්දමකින් සම්බන්ධ නොවිය යුතු ය.

(6) මේ නියෝගය යටතේ ආඥාවක් කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක දී සුදුසු ය යි අගමැති අදහස් කරන කොන්දේසිවලට යටත් ව, ආඥාව අත්හිට විය යුතු ය යි අගමැති විසින් නියම කළ හැකි අතර ඒ නියමය අගමැති විසින් යම් අවස්ථාවක දී අවලංගු කළ හැකි ය.

(7) මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය රැකීමට හෝ අත්‍යාවශ්‍ය සේවාවන් හා සැපයීම් පවත්වා ගෙන යාමට හානිකර ය යි තම මතය පරිදි අදහස් කරනු ලැබූ කරුණු හෝ, කෙළින් ම හෝ මහාජනයට හෝ ඔවුන් අතුරින් යම් කොටසකට පීඩා පැමිණවීමෙන් හෝ රජයට බලහත්කාරකම් පෑමට අදහස් කරනු ලැබූ යම් ක්‍රියාවක් කරන ලෙස තැනැත්තන් පොළඹවන හෝ උනන්දු කරවන කරුණු අඩංගු යම් ලේඛනයක් නිපදවීම සඳහා, යම් මුද්‍රණාලයක් හෝ යම් තැනැත්තකුගේ පාලනය යටතේ වූ මුද්‍රණාලයක් පාවිච්චි කරනු ලැබූ බව හෝ පාවිච්චි කරනු ලැබිය හැකි බව නියම බලධරයකුගේ මතය වුවහොත්, අවස්ථානුකූල ව මුද්‍රණාලය හෝ ඒ තැනැත්තාගේ පාලනය යටතේ පවත්නා මුද්‍රණාල සියල්ල හෝ ඉන් යමක් ආඥාව බල පවත්නා තෙක් කිනම් කාර්යයක් සඳහා හෝ ආඥාවෙහි නියමිත යම් කාර්යයක් සඳහා පාවිච්චි නො කළ යුතු ය යි නියම බලධරයා විසින් ආඥාවකින් නියම කළ හැකි ය. තවද (ආඥාව පනවනු ලැබුවේ යම් මුද්‍රණාලයක් සම්බන්ධයෙන් ද ඒ මුද්‍රණාලය හෝ එය අඩංගු වන යම් භූමියක හෝ ඒ මුද්‍රණාලයේ හෝ ඒ භූමියේ යම් කොටසක ස්වාමිත්වය භාර ගැනීම ඇතුළු ව) ආඥාවට අනුකූලත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය ය යි එලෙස බලය දෙනු ලැබූ තැනැත්තන්හට වැටහෙන පරිදි ක්‍රියා කිරීමට ආඥාවෙන් නියමිත තැනැත්තන්හට එබඳු යම් ආඥාවක් මගින් බලය පැවරිය හැකි ය.

(8) මේ නියෝගයේ (3) වෙනි හා (7) වෙනි ඡේදයන්හි කාර්‍යයන් සඳහා, අගමැති විසින් පත් කරනු ලැබූ තැනැත්තන්ගෙන් යුත් උපදේශක කාරක සභා එකක් හෝ වැඩි ගණනක් පිහිටුවනු ලැබිය යුතු ය. එවිට, මේ ඡේද දෙකෙන් එකක් යටතේ පනවනු ලැබූ යම් ආඥාවක් සම්බන්ධයෙන් සෑහීමට පත් නො වූ යම් තැනැත්තකුට ඒ පිළිබඳව තම විරුද්ධතාවන් සුදුසු උපදේශක කාරක සභාව වෙත ඉදිරිපත් කළ හැකි ය.

(9) මේ නියෝගයේ (3) වෙනි ඡෙදය හෝ (7) වෙනි ඡෙදය යටතේ ආඥාවක් පනවනු ලැබූ යම් අවස්ථාවක, ඒ ආඥාව සම්බන්ධයෙන් අගමැති වෙත ලියවිල්ලකින් කරුණු ඉදිරිපත් කළ හැකි බවත්, එසේ කරුණු ඉදිරිපත් කළත්, නොකළත් සුදුසු උපදේශක කාරක සභාව වෙත විරුද්ධතාවන් සැළ කර සිටිය හැකි බවත්, ආඥාවට සම්බන්ධ වූ පුවත් පත් හිමියා හෝ මුද්‍රණාලයේ අයිතිකරු වෙත දැනුම් දෙනු ලැබීමට කටයුතු සැලැස්වීම නියම බලධරයාගේ යුතුකම විය යුතු ය.

(10) ඉහත දක්වුණු පරිදි යම් විරුද්ධතාවන් සලකා බැලීම සඳහා පවත්වනු ලබන උපදේශක කාරක සභාවක යම් රැස්වීමක මුලාසනය අගමැති විසින් නම් කරනු ලැබූ සභාපතිවරයකු විසින් දැරිය යුතු අතර ස්වකීය විරුද්ධතාවන් සනාථ කිරිම සඳහා පුද්ගලික ව කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් විරුද්ධකරුට සලස්වා දීම සභාපතිගේ යුතුකම විය යුතු ය.

(11) ඉහත දක්වුණු පරිදි යම් විරුද්ධතාවන් පිළිබඳ ව උපදේශක කාරක සභාවක වාර්තාව අගමැති වෙත ඉදිරිපත් කළ යුතු ය. එය සලකා බැලීමෙන් පසු ව, විරුද්ධතාවන්ට අදළ වන ආඥාව අගමැති විසින් අවලංගු කළ හැකි ය; නැතහොත් වෙනස් කළ හැකි ය.

(12) මේ නියෝගයේ යම් විධිවිධානයක් හෝ මේ නියෝගයේ (6) වෙනි ඡෙදය යටතේ කරනු ලැබූ යම් නියමයක් හා සම්බන්ධ වූ යම් කොන්දේසියක් කඩ කිරීම් වශයෙන් යම් පුවත් පතක් මුද්‍රණය කරනු ලබන, පළ කරනු ලබන හෝ බෙද හරිනු ලබන අවස්ථාවක, ඒ පුවත් පතේ අයිතිකරු, කළමනාකරු, කර්තෘ හෝ ප්‍රකාශක, කොන්දේසිය කඩ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නියමය අවලංගු කරනු ලැබූ ව ද නො ලැබූ ව ද, වරදකට වෙන් වෙන් වශයෙන් වරදකරු විය යුතු ය.

(13) මේ නියෝගයෙහි—

(අ) " සිනමා චිත්‍රපටි " යන්නට ශබ්ද පථයක් ද ඒ බඳු චිත්‍රපටියක් ප්‍රදර්ශනය කිරිම සම්බන්ධයෙන් ශබ්ද ප්‍රජනනය කිරීමේ කාර්ය සඳහා ශබ්ද සටහන් කර ගනු ලබන අන් කිසි භාණ්ඩයක් ද ඇතුළත් වේ ;

(ආ) " ප්‍රකාශනය " යන්නෙන්, සිනමා චිත්‍රපටියක් සම්බන්ධ ව, මහාජනයාහට චිත්‍රපටිය ප්‍රදර්ශනය කිරිම අදහස් වන අතර, ඉහත කී පරිදි, චිත්‍රපටිය ප්‍රදර්ශනය කිරීම සම්බන්ධ ව යම් ශබ්දවල යාන්ත්‍රික හෝ විද්‍යුත් ප්‍රජනන එයට ඇතුළත් වේ ;

(ඇ) " පුවත් පත " යන්නට යම් සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ වෙනත් ප්‍රකාශනයක් ඇතුළත් වේ ; තව ද

(ඈ) " මුද්‍රණාලය " යන්නට මුද්‍රණය, ශිලා මුද්‍රණය, ඡායාරූප ශිල්පය, හෝ දෘශ්‍ය ආකාරයකින් වචන නිරූපණය කිරීමේ හෝ ප්‍රජනනය කිරීමේ වෙනත් පිළිවෙළක් සඳහා පාවිච්චි කළ හැකි යම් යන්ත්‍රයක්, උපකරණයක් හෝ යන්ත්‍ර පට්ටලයක් හෝ ඒ යන්ත්‍රයට, උපකරණ වලට හෝ යන්ත්‍ර පට්ටලයට අයිති යම් අච්චු අකුරු හෝ වෙනත් ද්‍රව්‍යයක් ඇතුළත් වේ.

තහනම් කරනු ලැබූ සංවිධාන.

21. (1) (අ) මහාජන ආරක්ෂාවට, මහාජන සාමය පවත්වාගෙන යාමට හෝ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යාමට හානිකර කාර්ය සඳහා ; හෝ

(ආ) මේ නියෝගවල 13 වෙනි නියෝගයෙහි (2) වෙනි ඡෙදයෙහි (අ) අනුඡෙදයෙහි හෝ (ආ) අනුඡෙදයෙහි හෝ 19 වෙනි නියෝගයෙහි (අ) සිට (ඌ) තෙක් අනුඡෙදවල සඳහන් කරනු ලැබූ කාර්යයන් අතුරෙන් යමක් සඳහා,

සංවිධානය විසින් හෝ එහි සාමාජිකයන් හෝ අනුගාමිකයන් විසින් ක්‍රියා කිරීමේ අන්තරාය ඇතැ යි හෝ සංවිධානය හෝ එහි සාමාජිකයන් හෝ අනුගාමිකයන් යොදවා ගැනීමේ අන්තරාය ඇතැ යි යම් සංවිධානයක් සම්බන්ධයෙන් අගමැති සෑහීමට පත්වන අවස්ථාවක, ඒ සංවිධානය තහනම් කරනු ලැබූ සංවිධානයක් ය යි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් අගමැති විසින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

(2) මේ නියෝගයේ (1) වෙනි ඡෙදය යටතේ යම් සංවිධානයක් තහනම් කරනු ලැබූ සංවිධානයක් ය යි ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක, තහනම් කරනු ලැබූ සංවිධානය මඟින් පවත්වා ගෙන යනු ලබන හෝ කලින් පවත්වා ගෙන යනු ලැබූ කටයුතුවලට සාරානුකූල ව සමාන කටයුතුවල නියුක්ත සෙසු සෑම සංවිධානයකට ම හා සෑම පුද්ගලයකුට ම හෝ පුද්ගල මණ්ඩලයකට ම හෝ තැනැත්තන් සමූහයකට ම, ඒ සංවිධානය. පුද්ගලයා හෝ පුද්ගල මණ්ඩලය හෝ තැනැත්තන් සමූහය තහනම් කරනු ලැබූ සංවිධානයක් වූ පරිදි මේ නියෝගය අදළ විය යුතු ය.

(3) කිසි ම තැනැත්තකු විසින්—

(අ) තහනම් කරනු ලැබූ සංවිධානයක් විසින් හෝ එහි යම් සාමාජිකයකු විසින් හෝ කළමනාකරුවකු විසින් පළ කරනු ලැබූ හෝ පළ කරනු ලැබී ය යි හැඟෙන යම් ලිඛිත හෝ මුද්‍රිත ද්‍රව්‍ය සකස් කිරීම, මුද්‍රණය කිරීම හෝ බෙද හැරීම, හෝ ඒ බඳු ද්‍රව්‍ය සකස් කිරීමට, මුද්‍රණය කිරීමට හෝ බෙද හැරීමට යම් ආකාරයකින් සම්බන්ධ ව සිටීම ; හෝ

(ආ) සංවිධානය විසින් හෝ එහි යම් කළමනාකරුවකු විසින් කරනු ලැබූ හෝ කරනු ලැබී ය යි හැඟෙන යම් ආඥාවක්, තීරණයක්, ප්‍රකාශයක් හෝ උපදේශයක්, හෝ ඊට අදළ වන යම් තොරතුරක් යම් ආකාරයකින් අන් කිසි තැනැත්තකුට දැනුම් දීම හෝ දැනුම් දීමට තැත් කිරීම ; හෝ

(ඇ) සංවිධානයේ හෝ එහි යම් සාමාජිකයන්ගේ හෝ කළමනාකරුවන්ගේ හෝ යම් රැස්වීමක් කැඳවීම හෝ ඊට සහභාගිවීම ; හෝ

(ඈ) සංවිධානයට බැඳෙන ලෙස හෝ ඊට ආධාර කරන ලෙස අන් කිසි තැනැත්තකුහට ආරාධනා කිරීම හෝ උනන්දු කිරීම ; හෝ

(ඉ) සංවිධානයේ කාර්ය සඳහා මුදලින් හෝ අන් ලෙසකින් ආධාර ඉල්ලීම හෝ එකතු කිරීම, හෝ ඉහත දැක්වෙන පරිදි යම් ආධාරයක් දීම ; හෝ

(ඊ) සංවිධානයේ කළමනාකරුවකු හෝ සාමාජිකයකු වශයෙන් තම තත්ත්වය අනු ව, හෝ තමා ඒ තත්ත්වය අනු ව ක්‍රියා කරන බව විශ්වාස කරන ලෙස අන් කිසි තැනැත්තකු පෙළඹවිය හැකි අන්දමේ කරුණු යෙදී තිබිය දී, යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම හෝ කිරීමට තැත් කිරීම,

නො කළ යුතු ය.

(4) නීතිපති විසින් හෝ සංවිධානයේ යම් සාමාජිකයකු හෝ ණය හිමියකු විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, යම් සංවිධානයක් මේ නියෝගයට අදාළ වන සංවිධානයක් ය යි ශ්‍රෙෂ්ඨාධිකරණයට පෙනී ගියහොත්, සංවිධානය විසින් හෝ එය සඳහා හිමි කර ගනු ලැබූ දේපළ අධිකරණයේ අවසරය නොමැති ව බැහැර කිරීමක් වැළැක්වීමට අවශ්‍ය ය යි පෙනී යන අන්දමේ ආඥාවක් කිරීම ද, ඉහත දැක්වෙන පරිදි යම් දේපළක් සම්බන්ධ ව හා සංවිධානයේ කටයුතු සම්බන්ධ ව පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් සකස් කරනු ලබන ලෙස නියම කිරීම ද, සංවිධානයේ ගණන් බේරා වසා දැමීම හා විසුරුවා හැරීම සඳහාත්, එ බඳු යම් පරීක්ෂණයක්, හා වාර්තාවක් සහ සංවිධානයේ ගණන් බේරා වසා දැමීම හා විසුරුවා හැරීම සම්බන්ධයෙන් දරනු ලැබූ යම් වියදම් පිළිබඳ ව හෝ ඒ සඳහාත්, අධිකරණයේ අනුමතිය ඇති ව ඉල්ලීමේ දිනයට පෙර හෝ ඉන්පසු ව නීත්‍යානුකූල ව බැඳුණු සංවිධානයේ ණය තුරුස් නිදහස් කිරීම පිළිබඳ ව හෝ ඒ සඳහාත් එ බඳු යම් දේපළක් ඉහත දැක්වුණු පරිදි යෙදවීම සඳහාත්, යුක්ති සහගත හා සාධාරණ ය යි අධිකරණයට පෙනී යන අන්දමේ අතිරේක ආඥාවන් කිරීම ද, අධිකරණය විසින් කළ හැකි ය. තව ද, ඉහත දැක්වුණු පරිදි යොදවනු ලැබීමට අධිකරණය විසින් නියම නො කරනු ලබන එ බඳු යම් දේපළක් මහා රාජිණිය වෙත රාජ සන්තක කළ යුතු ය යි අධිකරණය විසින් අණ කළ යුතු ය.

(5) මේ නියෝගයෙහි, '' කළමනාකරු '' යන්නෙන්, යම් සංවිධානයක් සම්බන්ධ ව, සංවිධානයේ යම් නිලධාරියකු ද සංවිධානයේ කළමනාකාරත්වයට හෝ පාලනයට සහභාගි වන, නැතහොත් කළමනාකාර හෝ පාලක තත්ත්වයක් දරන හෝ දරන බව හඟවන යම් තැනැත්තකු ද අදහස් වේ.

**සැක කරනු ලැබූ තැනැත්තන් පරිපාලනය කිරීම.**

22. (1) (අ) මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය පවත්වා ගෙන යාමට හෝ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යාමට හානි කරවන යම් ආකාරයකින් ක්‍රියා කිරීමෙන් ; හෝ

(ආ) මේ නියෝගවල 13 වෙනි නියෝගයෙහි (2) වෙනි ඡේදයෙහි (අ) අනුඡේදයෙහි හෝ (ආ) අනුඡේදයෙහි හෝ 19 වන නියෝගයෙහි, හෝ 21 වෙනි නියෝගයෙහි (3) වෙනි ඡේදයෙහි විධිවිධාන අතුරෙන් යමකට යම් ලෙසකින් පටහැනිව ක්‍රියා කිරීමෙන්,

යම් තැනැත්තකු වැළැක්වීමේ අදහසින් ඒ තැනැත්තා සම්බන්ධ ව එසේ කිරීම අවශ්‍ය ය යි තමාගේ මතය වන අවස්ථාවක, පහත දැක්වෙන සියලු කාර්ය හෝ ඉන් යමක් සඳහා, ස්ථිර ලේකම් විසින් ආඥාවක් පැනවිය හැකි ය :—

(i) ආඥාව මඟින්, හෝ ආඥාවෙහි නියමිත යම් බලධරයකු හෝ තැනැත්තන් විසින් ඔහුට අවසර දෙනු ලැබිය හැකි යම් පමණට හැර, ලංකාවෙහි එ ලෙස නියම කරනු ලැබිය හැකි යම් ප්‍රදේශයක ඒ තැනැත්තා නො සිටිය යුතු බවට වග බලා ගැනීම ; හා

(ii) ආඥාවෙහි නියම කරනු ලැබිය හැකි ආකාරයෙන්, එ බඳු වේලාවන්හි දී, හා එබඳු බලධරයකුට හෝ තැනැත්තකුට තමාගේ යාම් ඊම් දන්වන ලෙස ඔහුට නියම කිරීම,

(2) මේ නියෝගය යටතේ කරනු ලැබූ ආඥාවක් කඩ කිරීම් වශයෙන් යම් තැනැත්තකු යම් ප්‍රදේශයක සිටියහොත්, හෝ එ බඳු ආඥාවක නියමයන් අනු ව යම් ප්‍රදේශයකින් ඉවත් ව යාම පැහැර හැරියහොත්, ඔහුට විරුද්ධ ව පවත්වනු ලැබිය හැකි යම් නීති කෘත්‍යයකට හානියක් නො වන පරිදි, යම් පොලිස් නිලධරයකු විසින් හෝ ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ අන් කිසි තැනැත්තකු විසින් ඔහු ඒ ප්‍රදේශයෙන් ඉවත් කළ හැකි ය.

**සීමා කිරීමෙ ආඥා.**

23. (අ) මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය පවත්වා ගෙන යාමට හෝ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යාමට හානි කරවන යම් ආකාරයකින් ක්‍රියා කිරීමෙන් ; හෝ

(ආ) මේ නියෝගවල 13 වෙනි නියෝගයෙහි (2) වෙනි ඡේදයෙහි (අ) අනුඡේදයෙහි හෝ (ආ) අනුඡේදයෙහි හෝ 19 වෙනි නියෝගයෙහි, හෝ 21 වෙනි නියෝගයෙහි (3) වෙනි ඡේදයෙහි විධිවිධාන අතුරෙන් යමකට යම් ලෙසකින් පටහැනිව ක්‍රියා කිරීමෙන්,

යම් තැනැත්තකු වැළැක්වීමේ අදහසින් ඒ තැනැත්තා සම්බන්ධව එසේ කිරීම අවශ්‍ය ය යි තමාගේ මතය වන අවස්ථාවක, ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් —

(i) ආසන්න ම පොලිස් ස්ථානයේ කාර්ය භාර නිලධරයාගේ අවසරය නොමැති ව ඒ තැනැත්තා තම නිවසින් ඉවත්ව යාම තහනම් කරමින්, හා ආඥාවෙහි නියම කරනු ලබන හෝ ඒ නිලධරයා විසින් තීරණය කරනු ලබන අන්දමේ අවස්ථාවන්හි දී හැර, වෙන යම් තැනැත්තකු ඒ නිවසට ඇතුළුවීම හෝ ඉන් ඉවත් ව යාම තහනම් කරමින් ;

(ii) යම් නියමිත භාණ්ඩ ඒ තැනැත්තා විසින් ස්වාමිත්වයෙහි තබා ගැනීම හෝ භාවිත කිරීම තහනම් කරමින් හෝ සීමා කරමින් ; හා

(iii) ඔහුගේ වෘත්තිය හෝ ව්‍යාපාරය සම්බන්ධ ව ද, අනිකුත් තැනැත්තන් සමග ඔහුගේ ආශ්‍රය හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම සම්බන්ධ ව ද, ප්‍රවෘත්ති විසුරුවා හැරීම හෝ අදහස් පැතිරවීම පිළිබඳ ව ඔහුගේ කටයුතු සම්බන්ධ ව ද ආඥාවෙහි නියම කරනු ලැබිය හැකි අන්දමේ සීමා කිරීම් ඔහු කෙරෙහි නියම කරමින්

ආඥාවක් නිකුත් කළ හැකි ය.

පුපුරන ද්‍රව්‍ය, දරුණු ආයුධ හා නපුරු ද්‍රව්‍ය.

24. (1) ඔප්පු කිරීම ඒ තැනැත්තා වෙත පැවරිය යුතු නීත්‍යානුකූල බලය හෝ යුක්ති සහගත හේතුවක් නොමැතිව, අගමැති විසින් ආඥාවක මාර්ගයෙන් නියම කරනු ලබන ලංකාවේ යම් ප්‍රදේශයක, යම් පුපුරන ද්‍රව්‍යයක්, යම් දරුණු ආයුධයක් හෝ යම් නපුරු ද්‍රව්‍යයක් තම ස්වාමිත්වයෙහි හෝ තම පාලනය යටතේ තබා ගන්නා යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතුය.

(2) පොලිස් නිලධාරියකු විසින් හෝ තත්ත්වයෙන් කෝප්‍රල් කෙනෙකුට නො අඩු තත්ත්වයක සිටින ලංකා යුද්ධ හමුදාවේ සාමාජිකයකු විසින් හෝ තත්ත්වයෙන් ප්‍රධාන නැවියකුට නො අඩු තත්ත්වයක සිටින රාජකීය ලංකා නාවික හමුදාවේ සාමාජිකයකු විසින් හෝ තත්ත්වයෙන් කෝප්‍රල් කෙනෙකුට නො අඩු තත්ත්වයක සිටින රාජකීය ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු විසින්, මේ නියෝගය යටතේ වරදක් සිදුකරතැ යි විශ්වාස කිරීමට සෑහෙන කරුණු තමාට ඇති යම් තැනැත්තකුගේ ස්වාමිත්වයෙහි හෝ පාලනය යටතේ තිබෙන යම් පුපුරන ද්‍රව්‍යයක්, යම් දරුණු ආයුධයක් හෝ යම් නපුරු ද්‍රව්‍යයක් ඉවත් කළ හැකි ය.

(3) මේ නියෝගයෙහි —

"නපුරු ද්‍රව්‍යය" යන්නෙන් යම් දූල්වෙන සුලු, විබාදන හෝ වාෂ්පශීල ද්‍රව්‍යයක් අදහස් වේ ; තව ද

"දරුණු ආයුධය" යන්නෙන් බෝම්බයක් හෝ අත් බෝම්බයක් හෝ බෝම්බයක හෝ අත් බෝම්බයක ප්‍රයෝජනයට හෝ කාර්‍ය්‍යයට සමාන ප්‍රයෝජනයක් සඳහා හෝ කාර්‍ය්‍යයක් සඳහා සාදනු ලැබූ හෝ අදහස් කරනු ලැබූ අන් කිසි උපක්‍රමයක් හෝ යාන්ත්‍රික උපකරණයක් හෝ කායික තුවාළ සිදු කිරීමට පාවිච්චි කළ හැකි යම් ද්‍රව්‍යයක් අදහස් වේ.

182 අධි.

(4) තුවක්කු ආඥපනතේ කුමක් සඳහන් වුව ද, අගමැති විසින් ආඥාවක මාර්ගයෙන් නියම කරනු ලබන ලංකාවේ යම් ප්‍රදේශයක, බලය නොලත් තුවක්කුවල භාරය, ස්වාමිත්වය හෝ භාවිතය සම්බන්ධයෙන් ඒ ආඥපනතෙහි 22 වෙනි වගන්තියේ විධිවිධාන කඩ කිරීමේ හේතුවෙන් ඒ ආඥපනතට විරුද්ධ වරදකට වරදකරුවකු කරනු ලබන යම් තැනැත්තකු රුපියල් පන්දහසකට වැඩි නො වන දඩයකට හෝ අවුරුදු පහකට වැඩි නො වන කාලයක දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩයට හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම යටත් විය යුතු ය.

සීමා කරනු ලැබූ ස්ථාන.

25. (1) අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යාම සඳහා සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් අත් කර ගනු ලබන හෝ පාවිච්චි කරනු ලබන යම් ප්‍රදේශයකට, ස්ථානයකට හෝ භූමියකට බලය නො ලත් තැනැත්තන් ඇතුළුවීම වැළැක්වීම සඳහා විශේෂ ආරක්ෂා මාර්ග යෙදිය යුතුය යනු නියම බලධරයෙකුගේ මතයවුවහොත්, ආඥාවේ නියම කරනු ලැබියහැකි අන්දමේ බලධරයාගේ හෝ තැනැත්තාගේ අවසරය නොමැති ව ඒ ප්‍රදේශයට හෝ ස්ථානයට හෝ ඒ භූමියට ආඥාවෙහි නියම කරනු ලැබිය හැකි අන්දමේ නිදහස් කිරීම්වලට යටත් ව හැර, කිසිම තැනැත්තකු ඇතුළු නො විය යුතු යයි හෝ එහි රැඳී නො සිටිය යුතු යයි ඒ නියම බලධරයා විසින් ආඥාවකින් විධිවිධාන සැලැස්විය හැකි ය.

(2) මේ නියෝගය යටතේ පනවනු ලැබූ යම් ආඥාවක් කඩ කිරීම් වශයෙන් යම් තැනැත්තකු යම් ප්‍රදේශ යක, ස්ථානයක හෝ භූමියක සිටියහොත්, ඔහුට විරුද්ධ ව පවත්වනු ලැබිය හැකි අන් කිසි නීති කෘත්‍යයකට හානි නොවන පරිදි, යම් පොලිස් නිලධාරියකු විසින් හෝ ලංකා යුද්ධ හමුදාවේ, රාජකීය ලංකා නාවික හමුදාවේ හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ ඒ සඳහා නියම බලධරයකු විසින් බලය පවරනු ලැබූ අන් කිසි තැනැත්තකු විසින් ඔහු එ තැනින් ඉවත් කළ හැකි ය.

(3) මේ නියෝගයෙහි, "නියම බලධරයා" යන්නෙන්, යම් අත්‍යවශ්‍ය සේවයක් සම්බන්ධ ව, ඒ සේවයෙහි කාර්‍ය්‍යය සඳහා අගමැති විසින්, නමින් හෝ නිලයෙන්, නියම බලධරයකු වශයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තකු අදහස් වේ.

තැනැත්තන් රඳවා ගැනීම.

26. (1) (අ) මහාජන ආරක්ෂාවට හෝ මහාජන සාමය පැවැත්වීමට හෝ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාමට හෝ හානි පමුණුවන යම් ආකාරයකින් ක්‍රියා කිරීමෙන් ; හෝ

(ආ) මේ නියෝගවල 13 වෙනි නියෝගයෙහි (2) වෙනි ඡේදයෙහි (අ) අනුච්ඡේදයෙහි හෝ (ආ) අනුඡේදයෙහි හෝ 19 වෙනි නියෝගයෙහි, හෝ 21 වෙනි නියෝගයෙහි (3) වෙනි ඡේදයෙහි විධිවිධාන අතුරෙන් යමකට යම් ලෙසකින් පටහැනිව ක්‍රියා කිරීමෙන්,

යම් තැනැත්තකු වැළැක්වීමේ අදහසින්, ඒ තැනැත්තා සම්බන්ධ ව එලෙස ක්‍රියා කිරීම අවශ්‍ය ය යි, ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ මතය වන අවස්ථාවක, ඒ තැනැත්තා සිරභාරයට ගෙන සිරභාරයෙහි රඳවා ගැනීමට නියම කරන ආඥාවක් ඔහු විසින් කළ හැකි ය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි කරනු ලැබූ යම් ආඥාවක් ක්‍රියාත්මක කිරීමට හා ඒ සඳහා අවශ්‍ය විය හැකි සියලු බලය පාවිච්චි කිරීමට යම් පොලිස් නිලධරයකුට හෝ ලංකා යුද්ධ හමුදාවේ, රාජකීය ලංකා නාවික හමුදාවේ හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකුට බලය තිබිය යුතු ය.

(3) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතේ කරනු ලැබූ ආඥාවක ප්‍රකාර රඳවා තබනු ලැබූ යම් තැනැත්තකු නිත්‍යානුකූල සිරභාරයෙහි රඳවා තැබූ ලෙස සැලකිය යුතුය. එසේම පොලිස්පති විසින් බලය දෙනු ලැබූ ස්ථානයක, ඔහු විසින් නිකුත් කරනු ලැබූ උපදෙස් ප්‍රකාර ඔහු රඳවා තැබිය යුතුය. තවද බන්ධනාගාර ආඥපනත යටතේ පිහිටුවනු ලැබූ බන්ධනාගාරයක ඒ තැනැත්තා එසේ රඳවා තබනු ලැබූ විටක,

54 අධි.

(අ) ඒ ආඥපනතෙහි IX වෙනි කොටස හැර, ඒ ආඥපනතෙහි සියලු විධිවිධානයන් ද,

(ආ) සිරකරුවන් බැලීමට ඒම හා ඔවුන්ගේ ලිපි ගනුදෙනු සම්බන්ධයෙන් වූ ව්‍යවස්ථා හැර, ඒ ආඥපනත යටතේ පනවනු ලැබූ සියලු ව්‍යවස්ථාවන් ද,

ඒ ආඥපනතෙහි අර්ථය ඇතුළත, ඒ තැනැත්තා සිවිල් සිරකරුවකු ලෙස සැලකීමෙන්, ඒ තැනැත්තා කෙරෙහි අදාළ විය යුතුය.

එසේ වුවද ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් ඔහුට යෝග්‍ය යයි හැඟෙන අවස්ථාවක,

(අ) ඒ ආඥාපනතෙහි යම් විධිවිධාන හෝ මේ ඡේදයේ පෙරාතුව ම වූ විධිවිධාන යටතේ ඒ තැනැත්තාට අදාළ විය යුතු, ඒ ආඥාපනත යටතේ පනවනු ලැබූ යම් ව්‍යවස්ථා ඒ තැනැත්තා කෙරෙහි අදාළ නොවිය යුතු ය යි හෝ ආඥාවෙහි නියම කළ හැකි සංශෝධනයන්ට හෝ වෙනස්කිරීම් වලට යටත් ව අදාළ විය යුතු ය යි ආඥාවකින් නියම කළ හැකිය. එසේම

(ආ) ඒ ස්ථිර ලේකම් විසින්, කලින් කල නියම කරනු ලබන ආකාරයකට, වේලාවක හා ස්ථානයක දී ඒ තැනැත්තා බැලීමට ඒමට සහ ඔහුගේ ලිපි ගනුදෙනුවලට අවසර දිය හැකි ය.

(4) මේ නියෝගයෙහි කාර්‍ය්‍ය සඳහා අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබූ තැනැත්තන්ගෙන් සමන්විත උපදේශක කාරක සභාවල් එකක් හෝ වැඩි ගණනක් පිහිටුවනු ලැබිය යුතු ය. මේ නියෝගය යටතෙහි තමන්ට විරුද්ධව කරනු ලැබූ ආඥාවකින් පීඩා ලැබූ යම් තැනත්තකු විසින් ඔහුගේ විරුද්ධතාවන් ඒ කාරක සභාවට ඉදිරිපත් කළ හැකි ය.

(5) මේ නියෝගය යටතෙහි යම් තැනැත්තකුට විරුද්ධ ව ආඥාවක් කරනු ලැබුවේ ද ඒ සම්බන්ධයෙන් ලියවිල්ලකින් අගමැතිට කරුණු දැක්වීමට අවස්ථාවක් හැකි තරම් ඉක්මනින් ඒ තැනැත්තාට සලස්වා දීම ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ යුතුකම විය යුතු ය. එසේ කරුණු දැක්වීමක් කළත් නො කළත් ඉහත කී පරිදි උපදේශක කාරක සභාවකට ඔහුගේ විරුද්ධතාවන් දැක්වීම පිළිබඳ ඔහුගේ අයිතිය ඔහුට දැනුම් දිය යුතු ය. ඒ විරුද්ධතාවන් විමසීම හා ඒ පිළිබඳ ව සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් අග්‍රාණ්ඩුකාරවරයා විසින් ව්‍යවස්ථා සම්පාදනය කළ හැකි ය.

(6) ඉහත කී පරිදි ඒ විරුද්ධතාවන් සලකා බැලීම සඳහා පවත්වනු ලබන උපදේශක කාරක සභාවක යම් රැස්වීමක මූලාසනය අග්‍රාණ්ඩුකාරවරයා විසින් නම් කරනු ලබන සභාපති විසින් දැරිය යුතු ය. මේ නියෝගය යටතෙහි ඔහුට විරුද්ධ ව ආඥාව කරනු ලැබූ හේතු විරුද්ධකරුට දැන්වීම හා තම තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමට ඔහුට හැකිවීම පිණිස සභාපතිගේ මතය අනු ව සෑහෙන කරුණු ඔහුට සැපයීම සභාපතිගේ යුතුකම විය යුතු ය.

(7) උපදේශක කාරක සභාවක් තුන් දෙනකුගෙන් සමන්විත වූ අවස්ථාවක, එහි යම් රැස්වීමක ගණපූරණය දෙදෙනකු විය යුතු අතර උපදේශක කාරක සභාවක් තුන් දෙනකුට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ අවස්ථාවක, ගණපූරණය තුන් දෙනකු විය යුතු ය.

(8) ඉහත කී පරිදි යම් විරුද්ධතාවන් සම්බන්ධ උපදේශක කාරක සභාවක වාර්තාව ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත යැවිය යුතු ය. එය සලකා බැලීමෙන් පසු විරුද්ධතාව අදාළ වන ආඥාව ඔහු විසින් අවලංගු කළ හැකි ය.

(9) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි යම් තැනැත්තකු සම්බන්ධයෙන් ආඥාවක් කරනු ලැබුවේ ද ඒ තැනැත්තා මේ නියෝගවල 21 වෙනි නියෝගය යටතෙහි තහනම් කරනු ලැබූ සංවිධානයක සාමාජිකයකු හෝ සාමාජිකයකු වී සිටි බවට තමා සැක කරන බව ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ලියවිල්ලකින් සහතික කරන අවස්ථාවක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් මේ නියෝගයෙහි (4), (5), (6), (7) හා (8) වෙනි ඡේදවල විධිවිධාන අදාළ නො විය යුතු ය.

(10) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි කරනු ලැබූ ආඥාවක් ප්‍රකාර රඳවා ගනු ලැබූ යම් 6 අධි.
තැනැත්තකු සම්බන්ධයෙන් අධිකරණ ආඥාපනතේ 45 වෙනි වගන්තිය අදාළ නො විය යුතු ය.

(11) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි ආඥාවක් හෝ මේ නියෝගයෙහි (9) වෙනි ඡේදය යටතෙහි සහතිකයක් කිසි ම හේතුවක් නිසා යම් අධිකරණයක ප්‍රශ්න නො කරනු ලැබිය යුතු ය.

දේපළ බලයෙන් ගැනීම හා අත්කර ගැනීම.

27. (1) මහාජන ආරක්ෂාව, මහාජන සාමය රැක ගැනීම හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහා නියම බලධරයකුට අවශ්‍ය ය යි හෝ අවස්ථාවෝචිත ය යි අදහස් වන්නේ නම්, ඒ නියම බලධරයා විසින් මෙහි මින්මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත් ව (ලංකාවේ නේවාසික යම් තැනැත්තකුට අයිති හෝ ලංකාවෙහි තිබෙන හෝ ලංකාවෙහි යම් තොටුපළක තිබෙන යම් යාත්‍රාවක් හෝ ගගන යානයක් ඇතුළු ව) ලංකාවේ යම් භාණ්ඩයක් බලයෙන් ගත හැකි ය. තව ද බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය ය යි හෝ අවස්ථාවෝචිත ය යි පෙනී යන නියමයන් නියම බලධරයා විසින් කළ හැකි ය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදය යටතෙහි නියම බලධරයා විසින් යම් දේපළක් බලයෙන් 192 අධි.
ගන්නා අවස්ථාවක හෝ රාජකීය පරමාධිකාරයෙහි බලය ප්‍රකාර හෝ විදුලි සන්දේශ ආඥාපනතේ 365 අධි.
7 වෙනි වගන්තියෙන් හෝ ගගන යාත්‍ර පනතෙහි 7 වෙනි වගන්තියෙන් පවරනු ලැබූ යම් බලය ප්‍රකාර ක්‍රියාවේ යෙදවිය හැකි යම් බලයක් ක්‍රියාවේ යෙදවීමේ හේතුවෙන් (ඉඩම් හැර) යම් දේපළක් නියම බලධරයාගේ ස්වාමිත්වයට පත් වූ හෝ ඔහුට සුදුස්සක් කළ හැකි අවස්ථාවක, මහාජන ආරක්ෂාව, මහාජන සාමය රැක ගැනීම හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහා නියම බලධරයකුට අවස්ථාවෝචිත ය යි හැඟෙන ඒ කාර්‍ය්‍ය සඳහා ඒ අන්දමකින් නියම බලධරයා විසින් දේපළ පාවිච්චි කළ හැකි ය ; නැතහොත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකි ය ; නැතහොත් පාවිච්චි කිරීම හා ක්‍රියාකිරීම සම්බන්ධයෙන් බලය පැවරිය හැකි ය. දේපළ යම් උකසකින්, ඔඩපනයකින්, තබා ගැනීමේ අයිතියකින් හෝ වෙන යම් බැඳීමකින් නිදහස් වූවාක් මෙන් ද නියම බලධරයා එහි අයිතිකරු වූවාක් මෙන් ද ඔහු විසින් දේපළ තබා ගැනීම, විකිණීම හෝ වෙන යම් අන්දමකින් යමක් කිරීම කළ හැකි ය. බලයෙන් ගනු ලැබූ දේපළ යාත්‍රාවක්, වාහනයක්, ගගන යානයක්, භාරන යන්ත්‍රයක්, දෙඹකරයක්, කෘෂිකර්ම උපකරණයක් හෝ කෘෂිකර්ම යන්ත්‍රයක් වූ අවස්ථාවක, යාත්‍රාව, වාහනය, ගගන යානය, භාරන යන්ත්‍ර, දෙඹකරය, කෘෂිකර්ම උපකරණය හෝ කෘෂිකර්ම යන්ත්‍රය හිමි තැනැත්තාට නියම බලධරයා විසින් මේ නියෝගය ප්‍රකාර එය අත් කර ගත් බව සඳහන් දැන්වීමක් දීමෙන් එය අත් කර ගත හැකි ය.

(3) මේ නියෝගයෙහි (2) වෙනි ඡේදය යටතේ යම් යාත්‍රාවක, වාහනයක, ගගන යානයක, භාරන යන්ත්‍රයක, දෙඹකරයක, කෘෂිකර්ම උපකරණයක හෝ කෘෂිකර්ම යන්ත්‍රයක අයිතිකරුවකුට අත් කර ගැනීමේ දැන්වීමක් භාර දෙනු ලැබූ අවස්ථාවක, දැන්වීම භාර දුන් දවස ආරම්භයේ දී —

(අ) යාත්‍රාව, වාහනය, ගගන යානය, භාරන යන්ත්‍රය, දෙඹකරය, කෘෂිකර්ම උපකරණය හෝ කෘෂිකර්ම යන්ත්‍රය යම් උකසකින්, ඔඩපනයකින්, තබා ගැනීමේ අයිතියකින් හෝ වෙන යම් බැඳීමකින් නිදහස් ව නියම බලධරයා සතු විය යුතු ය.

(ආ) තව ද එය බලයෙන් ගැනීමේ කාලසීමාව කෙළවර විය යුතු ය.

(4) මේ නියෝගයෙහි (1) වෙනි ඡේදයෙන් පවරනු ලැබූ බලතල ප්‍රබල ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා එසේ කිරීම අවශ්‍ය ය යි නියම බලධරයකුට අදහස් වන්නේ නම් ඒ නියම බලධරයා විසින් මුළු ලංකාව හෝ එහි යම් නියමිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් ආඥවකින් —

(අ) ආඥව ක්‍රියාත්මක වන අවස්ථාවෙහි ආඥව අදාළ වන ප්‍රදේශයෙහි යම් භූමියක ආඥවෙහි විස්තර කරනු ලැබූ යම් භාණ්ඩයක් ස්වාමිත්වයෙහි හෝ පාලනය යටතෙහි තබා ගෙන සිටින කිසි ම තැනැත්තකු, ආඥවෙහි නියම කරනු ලැබූ තැනැත්තකු හෝ බලධරයකු ඒ භූමියෙන් භාණ්ඩ ඉවත් කිරීමට අවසර දෙන තුරු, භාණ්ඩය ඉවත් කිරීම, ඉවත් කරවීම හෝ ඉවත් කිරීමට අවසර දීම නො කළ යුතු යයි නියම කළ හැ කි ය ;

(ආ) නියෝගයෙහි නියම කරනු ලබන දිනයක ඉහත සඳහන් පරිදි ඒ භාණ්ඩය භූමියෙහි තිබුණේ ද නැද්ද නැතහොත් තිබෙන්නේ ද නැද්ද, තව ද එ සේ නම් ආඥවෙහි නියම කරන පරිදි ඒ දිනයෙහි භූමියෙහි තිබුන හෝ තිබෙන්නා වූ ඒ භාණ්ඩ ගණන හෝ ප්‍රමාණය සඳහන් ලිඛිත ප්‍රකාශයක් ආඥවේ නියමිත තැනැත්තාට හෝ බලධරයාට යවන ලෙස එකී ප්‍රදේශයෙහි යම් භූමියක අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කළ හැකි ය ; නැතහොත්

(ඇ) ආඥවේ සඳහන් එකී ප්‍රදේශය තුළ යම් වාහනයක් කලින් කලට අයිති ව සිටින හෝ ස්වකීය අයිතියෙහි හෝ භාරයෙහි හෝ ස්වකීය අයිතිය හෝ භාරය යටතෙහි හෝ ස්වකීය පාලනය යටතෙහි වූ තැනැත්තකු විසින් (අමතර කොටස් ඇතුළු ව) වාහනයට හා එහි කොටස්වලට ද එ සේ නියම කරනු ලබන අමතර උපකරණවලට ද අදළ තොරතුරු ආඥවේ නියමිත ඒ බලධරයාට හෝ තැනැත්තාට ලියවිල්ලකින් සපයන ලෙස නියම කළ හැකි ය.

(5) මේ නියෝගයෙහි පෙරාතු ව විධිවිධාන යටතෙහි පවරනු ලැබූ බලතල, වලංගු මුදල්, රත්රන්, සුරැකුම් පත් හෝ හුවමාරු පත්‍ර සම්බන්ධයෙන් ක්‍රියාවෙහි නො යෙදවිය යුතු ය.

(6) මේ නියෝගයෙහි භාණ්ඩ සම්බන්ධයෙන් යම් සඳහන් කිරීමක ද්‍රව්‍ය, වාහන හෝ සතුන් සම්බන්ධ සඳහන් කිරීමක් අන්තර්ගත ලෙස තේරුම් ගත යුතු ය.

(7) මහාජන ආරක්ෂාව, මහාජන සාමය රැක ගැනීම හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය හෝ අවස්ථාවෝචිත ය යි අදහස් වන්නේ නම්, ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් ලංකාවේ යම් නිශ්චල දේපළක් බලයෙන් ගෙන, එ සේ බලයෙන් ගැනීම සම්බන්ධයෙන්, අවශ්‍ය හෝ අවස්ථාවෝචිත ය යි ඔහුට පෙනී යන නියමයන් කළ හැකි ය.

(8) මේ නියෝගයෙහි (7) වෙනි ඡේදය යටතෙහි යම් නිශ්චල දේපළක් බලයෙන් ගනු ලැබූ අවස්ථාවක, මහාජන ආරක්ෂාව, මහාජන සාමය රැක ගැනීම හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවස්ථාවෝචිත ය යි පෙනී යන කාර්‍ය්‍ය සඳහා, එ වැනි අන්දමකින් ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් ඒ දේපළ පාවිච්චි කිරීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම කළ හැකි ය. නැතහොත් එය පාවිච්චි කිරීම හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා බලය පැවරිය හැකි ය.

(9) මේ නියෝගයෙහි පෙරාතු ව විධිවිධානවලින් යම් තැනැත්තකුට පවරනු ලැබූ බලතල ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් එ සේ කිරීමට ඉල්ලුම් කළ අවස්ථාවක, යම් පොලිස් නිලධරයකු හා රජයේ වෙන යම් නිලධරයකු ඒ තැනැත්තාට ආධාර හා සහාය දිය යුතු ය.

(10) මේ නියෝගයෙහි කාර්‍ය්‍යයන් සඳහා, " නියම බලධරයා " යන්නෙන්—

(අ) මගීන්ගේ ගමනාගමන සේවය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය (අමතර කොටස් ඇතුළුව) වාහන බලයෙන් ගැනීම හා මහජන ආරක්ෂාව, මහාජන සාමය රැක ගැනීම හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය යාත්‍රා බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් එ සේ පත් කරනු ලැබූ තැනැත්තකු හෝ එක් එක් තැනැත්තකු අදහස් වේ ;

(ආ) ආහාර ද්‍රව්‍ය ගෙන යාම සඳහා අවශ්‍ය (අමතර කොටස් ඇතුළු ව) වාහන බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් එ සේ පත් කරනු ලැබූ තැනැත්තකු හෝ එක් එක් තැනැත්තකු අදහස් වේ ;

(ඇ) සෞඛ්‍ය හා වෛද්‍ය කටයුතු සැලැස්වීම සඳහා අවශ්‍ය (වාහන ඇතුළු ව) භාණ්ඩ බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් එ සේ පත් කරනු ලැබූ තැනැත්තකු හෝ එක් එක් තැනැත්තකු අදහස් වේ ;

(ඈ) මහාජන සාමය රැක ගැනීම සඳහා අවශ්‍ය වාහන බලයෙන් ගැනීම සම්බන්ධයෙන් යුද්ධ හමුදවේ අණදෙන්නා, නාවික හමුදවේ අධිපති, ගුවන් හමුදවේ අණදෙන්නා හෝ පොලිස්පති අදහස් වේ ;

(ඉ) කෘෂිකර්ම කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් එ සේ පත් කරනු ලැබූ තැනැත්තකු හෝ එක් එක් තැනැත්තකු අදහස් වේ ;

(ඊ) තවද වෙන යම් භාණ්ඩයක් බලයෙන් ගැනීම සම්බන්ධයෙන් අගමැති විසින් නමින් හෝ නිලයෙන් එ සේ පත් කරනු ලැබූ තැනැත්තකු හෝ එක් එක් තැනැත්තකු අදහස් වේ.

(11) මේ නියෝගයෙහි කාර්‍ය්‍යය සඳහා " භාණ්ඩය " යන පාඨයට ඛනිජ තෙල් හෝ ඛනිජ තෙල්වල නිෂ්පාදනයක් හෝ අතුරු නිෂ්පාදනයක් ඇතුළු වේ.

කට කතා හා අසත්‍ය ප්‍රකාශ ප්‍රසිද්ධ කිරීම.

28. මහාජන භීතිය ඇති කළ හැකි යම් කට කතාවක් හෝ අසත්‍ය ප්‍රකාශයක් කිසිවකු විසින් ප්‍රසිද්ධ නො කළ යුතු ය.

ප්‍රසිද්ධ ස්ථානවල කථා පැවැත්වීම.

29. (1) ආඥාවකින් අගමැති විසින් නියම කරනු ලැබූ ලංකාවෙහි යම් ප්‍රදේශයක පිහිටි යම් ප්‍රසිද්ධ ස්ථානයක මහාජන සාමය කඩ කළ හැකි කථාවක් කිසි ම තැනැත්තකු විසින් නො කළ යුතු ය.

(2) මේ නියෝගයෙහි '' ප්‍රසිද්ධ ස්ථානය '' යන්නෙන් යම් මහා මාර්ගයක්, ප්‍රසිද්ධ උද්‍යානයක්, හෝ වත්තක්, මුහුදු වෙරළ හා මංමාවතක් වන හෝ නොවන යම් ප්‍රසිද්ධ පාලමක්, පාරක්, පටු මඟක්, අඩි පාරක්, චතුරශ්‍රයක්, මිදුලක්, මුඩුක්කුවක් හෝ දෙවටක් අදහස් වන අතර ගෙවීමෙන් හෝ වෙන අන්දමකින් මහාජනයා එවකට ඇතුළු වූ හෝ මහාජනයාට ඇතුළුවීමට ඉඩ දෙනු ලැබූ යම් විවෘත ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

පත්‍රිකා ආදිය බෙද හැරීම.

30. (1) පොලිස්පතිගේ හෝ පොලිස්පති විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් පොලිස් නිලධරයකුගේ අවසරය නොමැති ව, කිසි ම තැනැත්තකු විසින් යම් දැන්වීම් කොළ, අත් පත්‍රිකා හෝ පත්‍රිකා මහාජනයාට පෙනෙන යම් ස්ථානයක ඇලවීම හෝ මහාජනයා අතර බෙද හැරීම නො කළ යුතු ය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදය යටතෙහි තැනැත්තකු විසින් කරනු ලැබූ බවට චෝදිත වරදක් සම්බන්ධ යම් නීති කෘත්‍යයක දී යම් දැන්වීම් කොළ, අත් පත්‍රිකා හෝ පත්‍රිකා මහාජනයාට පෙනෙන ස්ථානයක ඇලවීමට හෝ මහාජනයා අතර බෙද හැරීමට පොලිස්පතිගෙන් හෝ පොලිස්පති විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් නිලධරයකුගෙන් හෝ අවසරය ඒ තැනැත්තාට නො තිබුණු බව සඳහන් පොලිස්පති විසින් අත්සන් තබන ලද සහතිකයක් පොලිස්පතිගේ අත්සන සම්බන්ධ ඔප්පු කිරීමක් නොමැති ව සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර ඒ සහතිකයෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් විනිශ්චයට භාජන විය යුතු සාක්ෂි විය යුතු ය.

මාර්ග, දුම්රිය මාර්ග ආදිය අවහිර කිරීම හෝ එබන්ධකට අලාභ හානි කිරීම.

31. අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ ලංකාවෙහි යම් ප්‍රදේශයක ප්‍රසිද්ධ පාරක්, පාලමක්, බෝක්කුවක්, යම් දුම්රිය මාර්ගයක් හෝ මහාමාර්ග ගමනා ගමන වාහනයක් නීත්‍යනුකූල බලය නොමැති ව කිසි ම තැනැත්තකු විසින් අවහිර කිරීම හෝ එබන්දකට අලාභහානි කිරීම නො කළ යුතු ය.

බය ගැන්වීම ආදිය වැළැක්වීම.

32. (1) වෙනයම් තැනැත්තකු වාසය කරන, වැඩ කරන, ව්‍යාපාර කටයුතු ගෙන යන හෝ සිටින ගෙයකට හෝ ස්ථානයකට හෝ එවැන්නක් ළඟට, ඒ ගෙයි හෝ ස්ථානයෙහි යම් තැනැත්තකු බය ගැන්වීමට එයට ඇතුළුවීම හෝ එයින් පිටවීම අවහිර කිරීමට හෝ සාමය කඩ කිරීමට තුඩු දෙන අන්දමකින් කිසි ම තැනැත්තකු නො යා යුතු ය.

(2) මේ නියෝගයෙහි '' බය ගැන්වීම '' යන පදයෙන්, තැනැත්තකුට ඔහුගේ පවුලෙහි යම් සාමාජිකය කුට හෝ ඔහුගේ යම් යැපෙන්නකුට හානි කිරීමක් හෝ යම් තැනැත්තකුට හෝ දේපළවලට සාහසික ක්‍රියාවක් හෝ අලාභ හානියක් සම්බන්ධයෙන් ඔහුගේ සිතෙහි සැක ඇති කිරීම අදහස් වන අතර, '' හානි කිරීම '' යන පදයෙහි තැනැත්තකුගේ ව්‍යාපාරය, වෘත්තීය, රක්ෂාව, හෝ වෙනත් ආදයම් මාර්ගයක් සම්බන්ධයෙන් ඔහුට හානි කිරීම ඇතුළත් වන අතර නඩු පැවරිය හැකි සිවිල් වරදක් ද ඇතුළත් වේ.

තුවක්කු හා පුපුරණ ද්‍රව්‍ය.

33. (1) අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ ලංකාවෙහි යම් ප්‍රදේශයක මහාජන ආරක්ෂාව හා මහාජන සාමය රැක ගැනීමේ අදහසින් පොලිස්පති විසින් යම් තැනැත්තකුගේ ස්වාමිත්වයෙහි තිබෙන යම් තුවක්කුවක් හෝ පුපුරන ද්‍රව්‍යයක් ඉවත් කිරීමට හා ඔහු විසින් නිශ්චය කරනු ලබන ස්ථානයක හා භාරයෙහි එය තැබීමට නියම කළ යුතුය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදය යටතේ පොලිස්පති විසින් නිකුත් කරනු ලැබූ යම් නියමයක නමින් හෝ නිලයෙන් නියම කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ නියමය ක්‍රියාවේ යෙදවිය හැකිය. ඒ නියමය ක්‍රියාවේ යෙදවීමේ කාය්‍ය්‍යය සඳහා වෙනයම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ඒ තැනැත්තාට සහාය විය හැකි අතර, යම් භූමියකට හෝ ස්ථානයකට ඇතුළුවීම හා ඒ භූමියට හා ස්ථානයට ඇතුළුවීමේ කාය්‍ය්‍යය සඳහා යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ ජනේලයක්, යම් තුවක්කුවක් හෝ පුපුරණ ද්‍රව්‍යයක් තබනු ලැබූ ලෙස ඒ තැනැත්තා විසින් සැක කරනු ලබන යම් භාජනයක් හෝ ගබඩාවක් විවෘත කිරීම හෝ කඩා විවෘත කිරීම කළ හැකි ය.

(3) මේ නියෝගයේ (1) වෙනි ඡෙදය යටතේ පොලිස්පති විසින් නිකුත් කරනු ලැබූ නියමයක් අදළ වන යම් තුවක්කුවක් හෝ පුපුරණ ද්‍රව්‍යයක් සැඟවීම හෝ ඒ නියමය ක්‍රියාවේ යෙදවීම වැළැක්වීමේ හෝ බාධා කිරීමේ අදහසින් වෙන යම් ක්‍රියාවක් කිසිම තැනැත්තකු විසින් නො කළ යුතු ය.

(4) මේ නියෝගය බලපවත්නා කාලය තුළ (1) වෙනි ඡෙදයෙහි සඳහන් කරනු ලැබූ ප්‍රදේශයක—

(අ) ආණ්ඩුවේ කිසි ම දිසාපතිවරයකු හෝ ආණ්ඩුවේ සහකාර දිසාපතිවරයකු හා තුවක්කු ආඥා පනතේ 51 වෙනි වගන්තිය යටතේ යම් දිසාපතිවරයකු විසින් පත් කරනු ලැබූ කිසි ම නියෝජිතයකු ඒ ආඥාපනතෙහි කාර්යයන් සඳහා බලපත්‍ර නිකුත් කරන බලධරයකු නො විය යුතු ය. ඒ ආඥාපනතෙහි කාර්යයන් සඳහා බලපත්‍ර නිකුත් කරන බලධරයා ස්ථිර ලේකම් විය යුතු ය. තව ද 182 අධි.

(ආ) ආණ්ඩුවේ කිසි ම දිසාපතිවරයකු, ආණ්ඩුවේ අතිරේක දිසාපතිවරයකු, ආණ්ඩුවේ සහකාර දිසාපතිවරයකු හෝ ආණ්ඩුවේ අතිරේක සහකාර දිසාපතිවරයකු හා පුපුරන ද්‍රව්‍ය පනතෙහි 6 වෙනි වගන්තිය යටතෙහි ඒ වෙනුවෙන් යම් දිසාපතිවරයකු විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබූ රජයේ කිසි ම සේවකයකු, ඒ පනතෙහි කාර්යයන් සඳහා බලපත්‍ර නිකුත් කරන බලධරයකු නො විය යුතු ය. ඒ පනතෙහි කාර්යයන් සඳහා බලපත්‍ර නිකුත් කරන බලධරයා ස්ථිර ලේකම් විය යුතු ය.

එසේ වුව ද, තුවක්කු ආඥාපනත යටතෙහි බලපත්‍ර නිකුත් කරන බලධරයා වශයෙන් ස්ථිර ලේකම් විසින්, ආණ්ඩුවේ යම් දිසාපතිවරයකු හෝ ආණ්ඩුවේ සහකාර දිසාපතිවරයකු, ඒ ආඥාපනතෙහි 49 වෙනි වගන්තිය යටතෙහි ස්වකීය නියෝජිතයකු වශයෙන් පත් කිරීම මේ ඡෙදයෙහි (අ) අනුච්ඡෙදයෙහි විධිවිධානවලින් වළක්වනු ලබන ලෙස නො සැලකිය යුතු ය.

183 අධි. තවද පුපුරන ද්‍රව්‍ය පනත යටතේ බලපත්‍ර දීමේ බලධරයා වශයෙන් ස්ථිර ලේකම් විසින් තම නියෝජිතයා වශයෙන් ඒ පනතෙහි 6 වෙනි වගන්තිය යටතේ යම් රජයේ නිලධරයකු පත් කිරීම මේ ඡෙදයෙහි (ආ) අනුච්ඡෙදයෙහි විධිවිධානවලින් වලක්වනු ලබන ලෙස නොසැලකිය යුතුය

(5) තුවක්කු ආඥාපනත යටතෙහි ඒ වෙනුවෙන් බලපත්‍ර ලැබූ යම් වෙළෙන්දකු විසින් පිටරටින් ලංකාවට ගෙන්වනු ලැබූ හෝ විකිණීම සඳහා ලංකාවෙහි යම් තැනක ඉදිරිපත් කරනු ලැබූ හෝ තබනු ලැබූ යම් තුවක්කු තහනමට අල්ලා ගැනීම හා ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන යම් ස්ථානයකට ඒවා ඉවත් කිරීම හා යම් ස්ථානයක ඉවත් නො කර තබා ගැනීම ස්ථිර ලේකම් විසින් අණ කළ හැකි ය.

(6) මේ නියෝගයෙහි (5) වෙනි ඡෙදය යටතෙහි ස්ථිර ලෙකම් විසින් නිකුත් කරනු ලැබූ ආඥාවක් අදළවන යුද්ධායුධ සැඟවීම හෝ ඒ ආඥාව ඉෂ්ට කිරීම වැළක්වීමේ අදහසින් වෙන යම් ක්‍රියාවක් කිසි ම තැනැත්තකු විසින් නො කළ යුතු ය.

183 අධි. (7) පුපුරන ද්‍රව්‍ය පනත යටතෙහි ඒ වෙනුවෙන් බලපත්‍ර ලැබූ යම් තැනැත්තකු විසින් පිටරටින් ලංකාවට ගෙන්වනු ලැබූ හෝ ලංකාවෙහි නිෂ්පාදනය කරනු ලැබූ, විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ හෝ තබනු ලැබූ, හෝ පුපුරන ද්‍රව්‍ය නිෂ්පාදකයකුගේ ව්‍යාපාරය ගෙන යාමට ඒ පනත යටතේ බලපත්‍ර ලැබූ යම් තැනැත්තකුගේ ස්වාමිත්වයෙහි වූ, යම් පුපුරන ද්‍රව්‍යයක් තහනමට අල්ලා ගැනීම, හා ස්ථිර ලේකම් විසින් නිශ්චය කරනු ලබන යම් ස්ථානයකට ඒවා ඉවත් කිරීම හා යම් ස්ථානයක ඉවත් නො කර තබා ගැනීම ස්ථිර ලේකම් විසින් අණ කළ හැකි ය.

(8) මේ නියෝගයෙහි (7) වෙනි ඡෙදය යටතෙහි ස්ථිර ලේකම් විසින් නිකුත් කරනු ලැබූ ආඥාවක් අදළ වන පුපුරන ද්‍රව්‍ය සැඟවීම හෝ ඒ ආඥාව ඉෂ්ට කිරීම වැළැක්වීමේ අදහසින් වෙන යම් ක්‍රියාවක් කිසි ම තැනැත්තකු විසින් නො කළ යුතු ය.

(9) මේ නියෝගයෙහි (5) වෙනි ඡෙදය හෝ (7) වෙනි ඡෙදය යටතෙහි ස්ථිර ලේකම් විසින් නිකුත් කරනු ලැබූ යම් ආඥාවක ඒ වෙනුවෙන් සඳහන් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ ආඥාව ඉෂ්ට කළ හැ කි ය. ඒ ආඥාව ඉෂ්ට කිරීමේ කාර්යය සඳහා, වෙන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ඒ තැනැත්තාට සහාය විය හැකි අතර, ඒ ආඥාවෙහි සඳහන් භූමියට හෝ ස්ථානයට ඇතුළු වී, ඒ භූමියට හෝ ස්ථානයට ඇතුළුවීම සඳහා යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ ජනේලයක් හෝ යම් තුවක්කු හෝ පුපුරන ද්‍රව්‍ය තබා ඇතැයි ඒ තැනැත්තා විසින් සැක කරනු ලබන භාජනයක් හෝ ගබඩාවක් විවෘත කිරීම හෝ කඩා විවෘත කිරීම කළ හැකි ය.

(10) (අ) තුවක්කු ආඥාපනත යටතෙහි නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ තුවක්කු වෙළෙන්දකු වූ, හෝ

(ආ) පුපුරන ද්‍රව්‍ය පනත යටතෙහි නිකුත් කරනු ලැබූ බලපත්‍රයක බලය යටතේ පුපුරන ද්‍රව්‍ය පිටරටින් ගෙන්වන්නකු, නිෂ්පාදය කරන්නකු, විකුණන්නකු හෝ සපයන්නකු වූ හෝ

(ඇ) පුපුරන ද්‍රව්‍ය පනත යටතෙහි ප්‍රදානය කරනු ලැබූ අවසර පත්‍රයක් දරන්නකු වූ, හැම තැනැත්තකු ම ස්ථිර ලේකම් විසින් සඳහන් කරනු ලැබූ කාලය ඇතුළත ස්ථිර ලේකම්ට කලින් කලට

අවශ්‍ය වන වාර වාර්තා ස්ථිර ලේකම් වෙත සැපයිය යුතු ය.

(11) මේ නියෝගය බලපවත්නා කලය තුළ (1) වෙනි ඡෙදයෙහි සඳහන් කරනු ලැබූ යම් ප්‍රදේශයක තුවක්කු ආඥාපනතෙහි 25 වෙනි වගන්තියද, පුපුරන ද්‍රව්‍ය පනතෙහි 10 වෙනි හා 22 වෙනි වගන්ති ද බල නො පැවැත්විය යුතු ය.

(12) මේ නියෝගයෙහි —

" තුවක්කුව " යන්නෙහි තුවක්කු ආඥාපනතෙහි එය ට දී ඇති අර්ථයම විය යුතු ය. තව ද

" ස්ථිර ලේකම් " යන්නෙන් තුවක්කු ආඥාපනත සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් අදහස් වන අතර පුපුරන ද්‍රව්‍ය පනත සම්බන්ධයෙන් ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් අදහස් වේ.

පැට්‍රෝල් විකිණීම හෝ සැපයීම විධිමත් කිරීම හා පාලනය කිරීම.

34. (1) අගමැති විසින් ආඥාවකින් නියමිත ලංකාවේ යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන්, නියම බලධරයකු විසින්, නියමයන්හි නියමිත යම් ප්‍රදේශයක පැට්‍රෝල් සිල්ලර ගබඩාවක් භාරයේ ඇති තැනැත්තකු විසින් පැට්‍රෝල් බෙද හැරීම හෝ විකිණීම විධිමත් කිරීම හා පාලනය සුරක්ෂිත කිරීමේ කාර්ය්‍යය සඳහා අවශ්‍ය විය හැකි සියලු නියමයන් කලින් කල නිකුත් කළ හැකි ය. තවද ඒ නියමයන් ඉෂ්ට කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(2) යම් පැට්‍රෝල් සිල්ලර ගබඩාවක් භාරයේ ඇති තැනැත්තකු විසින් පැට්‍රෝල් විකිණීම හෝ සැපයීම සම්බන්ධයෙන් මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදය යටතේ නියම බලධරයකු විසින් නිකුත් කරනු ලැබූ නියමවල, ඒ බලධරයා විසින් කලින් අනුමත කරනු ලැබූ තැනැත්තන්ට හැර, ඒ ගබඩාවේ දී යම් තැනැත්තකුට පැට්‍රෝල් විකිණීම හෝ සැපයීම වළක්වන්නා වූ හෝ, යම් විශේෂ තැනැත්තකුට හෝ යම් විශේෂ පන්තියක හෝ විස්තර යක තැනැත්තන්ට හෝ පැට්‍රෝල් සැපයීම වළක්වන්නා වූ ද ඒ ගබඩාවෙහි පැට්‍රෝල් විකිණීම හෝ සැපයීම විධිමත් කිරීමේ හා පාලනය කිරීමේ කාර්ය්‍යය සඳහා අවශ්‍ය විය හැකි අන් කිසි සියලු කරුණු සම්බන්ධයෙන් ද විධිවිධාන ඇතුළත් විය හැකි ය.

(3) මේ නියෝගයෙහි " පැට්‍රෝල් " යන පාඨයෙන් පැට්‍රෝල් (සැපයීම් පාලනය කිරීමේ) ආඥාපනතෙහි විස්තර කරනු ලැබූ පැට්‍රෝල් අදහස් වේ. තවද " පැට්‍රෝල් සිල්ලර ගබඩාව " යන්නෙන් පැට්‍රෝල් සිල්ලර වශයෙන් විකුණනු ලබන යම් ගබඩාවක්, ස්ථානයක් හෝ අන් කිසි භූමියක් අදහස් වේ. අධි. 174.

35. අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ ලංකාවෙහි යම් ප්‍රදේශයක ඇන්ජිමක්, ඇඳූ රථයක්, මැදිරියක්, ට්‍රක් රථයක් හෝ වාහනයක් තුළ හෝ මත සිටින යම් තැනැත්තකුගේ ආරක්ෂාවට හානිවන පරිදි යම් දුම්රිය මාර්ගයක, ඇන්ජිමකට, ඇඳූ රථයකට, මැදිරියකට හෝ ට්‍රක් රථයකට හෝ යම් ප්‍රසිද්ධ පාරක යම් වාහනයකට, කිසි ම තැනැත්තකු විසින් කිසි මු දෙයක් හෝ ද්‍රව්‍යයක් වීසි නො කළ යුතු ය. දමා ගසන ආයුධ විසි කිරීම.

36. (1) අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ ලංකාවෙහි යම් ප්‍රදේශයක කිසි ම තැනැත්තකු විසින් පතරොන් දමනු ලැබූ හෝ නොදමනු ලැබූ යම් තුවක්කුවක් වෙන යම් තැනැත්තකු කෙරෙහි, නීත්‍යානුකූල හේතුවක් නොමැති ව එල්ල නොකළ යුතු ය. තුවක්කුව එල්ල කිරීම.

(2) මේ නියෝගයෙහි " තුවක්කුව " යන පදයට තුවක්කු ආඥාපනතෙහි එයට දී තිබෙන අර්ථයම ඇත්තේ ය.

37. (1) කිසි ම තැනැත්තකු විසින් අගමැති විසින් ආඥාවකින් නියම කරනු ලැබූ යම් ප්‍රදේශයක පහත දැක්වෙන සියලු ක්‍රියා හෝ ඉන් යමක් නො කළ යුතු ය — දුම්රිය, තැපැල් හා ගමනාගමන සේවයන් සමහ අයුතු ලෙස මැදහත් වීම ආදිය.

(අ) ගමන් කිරීමට බලය දෙන අවසර පත්‍රයක් නොමැති ව පළමු ව තම ගාස්තුව ගෙවා ප්‍රවේශ පත්‍රයක් නො ලබා හෝ රජය විසින් පවත්වාගෙන යනු ලබන යම් දුම්රියක ගමන් කිරීම.

(ආ) ඒ දුම්රිය ක්‍රියා කරවීම සම්බන්ධයෙන් කිනම් ආකාරයකින් වුවද බාධා කිරීම හෝ අයුතු ලෙස මැදහත් වීම.

(ඇ) රජය විසින් පවත්වාගෙන යනු ලබන තැපැල් සේවාවන්ට කිනම් ආකාරයකින් වුව ද බාධා කිරීම හෝ ඒ සම්බන්ධයෙන් අයුතු ලෙස මැදහත් වීම.

(ඈ) පළමු ව තම ගාස්තුව ගෙවා ප්‍රවේශ පත්‍රයක් නො ලබා මහා මාර්ග ගමනාගමන වාහනයක ගමන් කිරීම.

(ඉ) එ බඳු වාහනයක් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් කිනම් ආකාරයකින් වුව ද බාධා කිරීම හෝ අයුතු ලෙස මැදහත් වීම.

(2) ගමන් කිරීම සඳහා බලය දෙන අවසර පත්‍රයක් නොමැති ව හෝ පළමු ව තම ගාස්තුව ගෙවා ප්‍රවේශ පත්‍රයක් නො ලබා රජය විසින් පවත්වාගෙන යනු ලබන දුම්රියක ගමන් කිරීම හෝ පළමු ව තම ගාස්තුව ගෙවා ප්‍රවේශ පත්‍රයක් නො ලබා මහාමාර්ග ගමනාගමන වාහනයක ගමන් කිරීම යන කරුණ නිසා ම පමණක් තම සේවයේ බලය හෝ අන් ලෙසකින් ලැබූ බලය ප්‍රකාර තමාට එසේ කිරීමට හිමිකම ඇති වුවහොත් මේ නියෝගයේ (1) වෙනි ඡෙදයේ (අ) අනුච්ඡෙදයේ හෝ (ඈ) අනුච්ඡෙදයේ හෝ විධිවිධාන යම් තැනැත්තකු උල්ලංඝනය කළ ලෙස නො සැලකිය යුතු ය.

38. යම් හදිසි නියෝගයකින් අගමැති වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, යුතුකමක් හෝ කාර්යයක්, අගමැති විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ වෙන යම් ඇමතිවරයකු විසින් ක්‍රියාවේ යෙදවීම හෝ ඉෂ්ට කිරීම කළ හැකි ය. හදිසි නියෝග යටතෙහි අගමැතිගේ බලතල, යුතුකම් හා කාර්යයන් නියෝජනය කිරීම.

39. යම් හදිසි නියෝගයකින් හෝ එය යටතේ, යම් තැනැත්තකුට පවරනු හෝ නියම කරනු ලැබූ යම් බලයක් හෝ යුතු කමක් ඉෂ්ට කිරීමේ හෝ ක්‍රියාවේ යෙදවීමේ දී ඒ තැනැත්තාට කිසි ම තැනැත්තකු විසින් විරෝධය පෑම හෝ අවහිර කිරීම නොකළ යුතු ය. බලය දරන තැනැත්තන්ට විරෝධය පෑම හා අවහිර කිරීම.

40. (1) යම් හදිසි නියෝගයක් හෝ එවැනි යම් නියෝගයක් යටතෙහි කරනු ලැබූ යම් ආඥාවක් හෝ ව්‍යවස්ථාවක් හෝ එවැනි නියෝගයක් යටතෙහි දෙනු ලැබූ නියමයක් හෝ නියම කරනු ලැබූ නියමයක් අනු ව ක්‍රියා කිරීම යම් තැනැත්තකු උල්ලංඝනය කරතහොත් හෝ පැහැර හරිතහොත්, ඔහු වරදක් සම්බන්ධයෙන් වරදකරු විය යුතුය. තව ද සුළු අපරාධ විනිශ්වයකරුවකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමෙන් පසු ඒ නියෝගයෙහි සඳහන් යම් විශේෂ විධිවිධානවලට යටත් ව, මාස තුනකට අඩු නො වූ ද අවුරුදු පහකට වැඩි නොවූ ද බරපතළ වැඩ ඇති ව බන්ධනාගාරගත කිරීමට හා රුපියල් පන්සියයකට අඩු නොවූ ද රුපියල් පන්දහසකට වැඩි නොවූ ද දඩයකට යටත් විය යුතු ය. දඩුවම.

(2) යම් හදිසි නියෝගයක් යටතෙහි වරදක් සඳහා ඒ නියෝගයෙහි දඩුවමක් නියම කරනු නො ලැබූ අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වූ තැනැත්තකු සුළු අපරාධ විනිශ්වයකරුවකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු, මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදයෙහි නියම කරනු ලැබූ දඩුවමට ම යටත් විය යුතු ය.

(3) අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 15 ආ වෙනි වගන්තිය හා දඬ ගෙවීමේ (ලඝු අධිකරණ) ආඥාපනතේ 6 වෙනි වගන්තිය හදිසි නියෝගයක් යටතෙහි වරදක් සම්බන්ධයෙන් වරදකරු වූ තැනැත්තකුට අදාළ නොවිය යුතු ය. 20 අධි. 10 අධි.

41. (1) හදිසි නියෝගයක් යටතෙහි යම් වරදක් කිරීමට තැත් කරන හෝ කිරීමට සූදානම් ව යම් කාර්ය යක් කරන යම් තැනැත්තකු ඒ නියෝගය යටතෙහි වරදක් සම්බන්ධයෙන් වරදකරු වශයෙන් සලකනු ලැබිය යුතු ය. වරදවල් කිරීමට තැත්කිරීම හා වරද කරුවන්හට සහාය දීම.

(2) යම් හදිසි නියෝගයක් යටතෙහි වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු බව දන්නා හෝ විශ්වාස කිරීමට සෑහෙන හේතු ඇති කිසි ම තැනැත්තකු විසින් එකී වරද සඳහා ඒ තැනැත්තා අල්ලා ගැනීම, විභාග කරනු ලැබීම හෝ දඬුවම් දෙනු ලැබීම වැළැක්වීමේ, බාධා කිරීමේ හෝ මැදිහත් වීමේ අදහසින් ඒ තැනැත්තාට කිසි ම සහායක් නො දිය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වරදවල්.

42. යම් හදිසි නියෝගයක් යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ මණ්ඩලය නීතිගත සංස්ථාවක් නම්, ඒ නීතිගත සංස්ථාවේ හැම අධ්‍යක්ෂකයකු ම, හා

(ආ) ඒ මණ්ඩලය ව්‍යාපාර ආයාතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ හැම හවුල්කරුවකු ම, තමාගේ දැනුම නොමැතිව ඒ වරද කරනු ලැබූ බව හා ඒ වරද කිරීම වැළැක්වීමට නියම ලෙස සම්පූර්ණයෙන් අනලස් ව ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු වශයෙන් සැලකිය යුතු ය.

ඇපදීම.
19 අයි.

43. (1) යම් නීතියක කුමක් සඳහන් වුව ද මේ නියෝගයේ (2) වෙනි ඡෙදයේ විධිවිධානවලට යටත් ව ආඥවකින් අගමැති විසින් නියම කරනු ලැබූ ලංකාවේ යම් ප්‍රදේශයක සිදු කරනු ලැබූ ද දණ්ඩ නීති සංග්‍රහයේ VI වෙනි පරිච්ඡෙදය, VII වෙනි පරිච්ඡෙදය හෝ VIII වෙනි පරිච්ඡෙදය යටතේ වූ ද යම් වරදක් හෝ යම් හදිසි නියෝගයක් යටතේ යම් වරදක් හෝ සම්බන්ධයෙන් චෝදනා ලැබූ යම් තැනැත්තකු ඇප පිට නිදහස් කිරීමට නීතිපති විසින් ලියවිල්ලකින් අනුමතිය දෙනු ලැබුවහොත් මිස හෝ ඒ තැනැත්තා ඇප පිට නිදහස් කිරීමට තමා විරුද්ධ නො වන බව සහාකර පොලිස් අධිකාරියකුගේ තත්ත්වයට වඩා පහත් තත්ත්වයක නො වන පොලිස් නිලධරයකු විසින් කට වචනයෙන් හෝ ලියවිල්ලකින් දන්වා සිටියහොත් මිස කිසි ම අධිකරණයක් මඟින් ඒ තැනැත්තා ඇප පිට නිදහස් නො කළ යුතු ය.

(2) හදිසි නියෝගයක් යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ යම් තැනැත්තකු දින දහහතරක් හෝ ඊට වැඩි කාලයක් සිරභාරයේ සිටි අවස්ථාවක අධිකරණය විසින් ඔහු ඇප පිට හෝ අධිකරණයේ පෙනී සිටීම සඳහා ඔහු විසින් ඇප කරුවන් නොමැති ව ඇපකරයක් ලියා අත්සන් කිරීමේ දී, නිදහස් කළ යුතු ය. තව ද ඇපකරයේ හෝ ඇපකරුවන් නො මැතිව ලියා අත්සන් කරන බැඳුම්කරයේ මුදල් ප්‍රමාණය —

(අ) ඒ වරද 19 වෙනි නියෝගය හෝ 23 වෙනි නියෝගය යටතේ වරදක් වූ විටක, රුපියල් එක් දහසකට නො වැඩි වන සාධාරණ මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

(ආ) තව ද ඒ වරද වෙනත් හදිසි නියෝගයක් යටතේ වරදක් වූ විටක, රුපියල් පන්සියයකට නො වැඩි වන සාධාරණ මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි වෙනස් කිරීම.

44. (1) අගමැති විසින් ආඥවකින් නියම කරනු ලබන ලංකාවේ යම් ප්‍රදේශයක මේ නියෝගය අඛණ්ඩව බල පැවැත්වෙන අතර —

(අ) දණ්ඩ නීති සංග්‍රහයෙහි නීති විරෝධි රැස්වීම් විසුරුවා හැරීමේ බලයට අදළ වන 99, 100, 101, 102 හා 103 වෙනි වගන්තිය බලපැවැත්වීම අවසන් විය යුතු ය ;

(ආ) තව ද තත්ත්වයෙන් සරයන් කෙනකුට නො අඩු තත්ත්වයක සිටින යම් පොලිස් නිලධාරියකු විසින් හෝ තත්ත්වයෙන් කෝපරල් කෙනකුට නො අඩු තත්ත්වයක සිටින ලංකා යුද්ධ හමුදවේ යම් සාමජිකයකු විසින් හෝ තත්ත්වයෙන් ප්‍රධාන නැවියකුට නො අඩු තත්ත්වයක සිටින රාජකීය ලංකා නාවික හමුදවේ යම් සාමාජිකයකු විසින් හෝ තත්ත්වයෙන් කෝපරල් කෙනෙකුට නො අඩු තත්ත්වයක සිටින රාජකීය ලංකා ගුවන් හමුදවේ යම් සාමාජිකයකු විසින් හෝ යම් ප්‍රසිද්ධ මාර්ගයක, දුම්රිය මාර්ගයක, ප්‍රසිද්ධ පිට්ටනියක පොදු විනෝද ක්‍රීඩා භූමියක හෝ වෙනත් ප්‍රසිද්ධ භූමියක, මුහුදු වෙරළෙහි, හෝ යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් හෝ රජයේ දෙපාර්තමේන්තුවක් අසළ හෝ එහි භූමියෙහි සිටින යම් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසිරී යාමට හා ආඥවෙහි සඳහන් කරනු ලැබිය හැකි අන්දමේ වෙනත් ස්ථානයකට ඉවත් ව යැමට අණ කළ හැකි ය. තවද ඒ ආඥව අනු ව ක්‍රියා කිරීමට ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(2) එබඳු ආඥවක් නිකුත් කිරීමට බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදයේ (ආ) අනුච්ඡෙදය යටතේ ආඥවක් නිකුත් කරනු ලැබූ විට, යම් තැනැත්තකු ඒ ආඥවට අනුකූල ව ක්‍රියා නො කරතහොත් හෝ ඒ ආඥවට අනුකූල ව ක්‍රියා නො කිරීමේ අධිෂ්ඨානයක් පෙන්වන ආකාරයට හැසිරෙතහොත්, ඒ නිලධරයා විසින් සන්නද්ධ බලය ඇතුළු බලයෙන් ඒ ආඥව ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කළ හැකි අතර, අවශ්‍ය වුවහොත්, ඒ ආඥව ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ඒ තැනැත්තාට නීත්‍යනුකූල ව දඬුවම් පැමිණිවීම සඳහා ඒ තැනැත්තා ඉවත් කරනු ලැබ හෝ සිරභාරයට ගනු ලැබ, රඳවා ගනු ලැබීමට සැලැස්විය හැකි ය.

20 අයි.

(3) මේ නියෝගය බලපවත්නා කාලය තුළ, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 325 වෙනි වගන්තිය, යම් හදිසි නියෝගයක් යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ ඔහු සම්බන්ධයෙන් අදළ නො විය යුතුය.

හදිසි නියෝග යටතේ වරදවල් සම්බන්ධ නීති කෘත්‍ය සඳහා ප්‍රමුඛත්වය.

45. අධිකරණයේ වෙන යම් කටයුත්තක හදිසි තාවය සම්බන්ධ විශේෂ කරුණු නිසා එසේ කිරීම අපහසු වුවහොත් මිස, හදිසි නියෝග යටතේ යම් තැනැත්තකු විසින් කරනු ලැබූ බවට චෝදිත වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක යම් නීති කෘත්‍යයක්, ඒ අධිකරණයේ වෙනත් යම් කටයුතුවලට පෙර විභාග කරනු ලැබිය යුතු ය.

ආණ්ඩුවේ දිසාපතිවරයකුගේ බලතල, යුතුකම් හා කාර්යයන් සම්බන්ධතා නිලධරයකු විසින් පාවිච්චි කිරීම හෝ ඉෂ්ට කිරීම කළ හැකි බව.

46. (1) ආඥවෙහි නියමිත, ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා සම්බන්ධතා නිලධරයකු ලෙස යම් තැනැත්තකු නාමයෙන් හෝ නිලයෙන් අගමැති විසින් ආඥවක මගින් පත් කළ හැකි ය.

(2) ලංකාවෙහි යම් ප්‍රදේශයක් සඳහා ආඥවක් මගින් සම්බන්ධතා නිලධරයකු අගමැති විසින් පත් කළ විටක ඒ නිලධරයා විසින් ලිඛිත නීතියක් යටතේ හෝ අන් ලෙසකින් ආණ්ඩුවේ දිසාපති වෙත පැවරුණු හෝ නියමිත සියලු බලතල යුතුකම් හෝ කටයුතු ඒ ප්‍රදේශය තුළ ක්‍රියාවේ යෙදවිය යුතු ය. ඉෂ්ට කළ යුතු ය. නැතහොත් කළ යුතු ය. තව ද ඒ කාර්යය සඳහා ඒ ලිඛිත නීතියෙහි ආණ්ඩුවේ දිසාපති ගැන වූ හැම සඳහන් කිරීමක් ම ඒ ප්‍රදේශය පිළිබඳ ව අදළ කිරීමෙහි දී, ඒ සම්බන්ධතා නිලධරයා ගැන වූ සඳහන් කිරීමක් ලෙස තේරුම් ගත යුතු ය.

නීති කෘත්‍ය, අධිකරණ වාර ආදිය.

47. (1) මෙහි අන් ලෙසකින් සලස්වනු ලැබූ පරිද්දෙන් හැර, හා අන් කිසි ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, යම් හදිසි නියෝගයක් යටතේ, යම් තැනැත්තකු විසින් කරන ලද යි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් නීති කෘත්‍ය, ලංකාවේ එවකට ඒ තැනැත්තා සිටින ස්ථානයේ අධිකරණ බලය ඇති නිසි අධිකරණය ඉදිරියේ පැවැත්විය හැකි ය.

(2) නීතිපති විසින් —

(අ) හදිසි නියෝගයන් යටතේ තැනැත්තන් විසින් කරන ලදයි කියනු ලබන වැරදි: හෝ

(ආ) ඒ නියෝගයන් යටතේ යම් බලතලයක් හෝ යුතුකමක් කෙළින් ම හෝ නො එසේව ක්‍රියාත්මක කරවීමේ දී හෝ ඉටු කිරීමේ දී හෝ කල්පිත ක්‍රියාත්මක කරවීමේ දී හෝ ඉටු කිරීමේ දී කිරීමෙන් හෝ නොකර හැරීමෙන් පැන නැගුණු හෝ ඇති වූ වරදවල් සංගෘහිත වන ක්‍රියා හෝ නොකර හැරීම් වූ අන්කිසි ලිඛිත නීතියක් යටතේ තැනැත්තන් විසින් කරන ලද යි කියනු ලබන වරදවල්,

කවර අධිකරණයක දී විභාග කළ යුතු ද හෝ විසඳිය යුතු ද යනු තීරණය කළ හැකි ය. ඒ වරදවල් ඒ අධිකරණයෙහි අධිකරණ බල සීමා තුළ කරන ලද නම්, ඒ අධිකරණය ඒ වරදවල් විභාග කිරීමට හෝ විසඳීමට අධිකරණ බලය සතු අධිකරණයක් විය යුතු ය.

(3) නීතිපති මේ නියෝගයෙහි (2) වෙනි ඡෙදය යටතේ යම් වරදක් විභාග කළ යුතු හෝ විසඳිය යුතු අධිකරණය තීරණය කිරීමේ දී ඔහු ලියවිල්ලකින් තම බලය දීමෙන් ඒ වරද විභාග කළ යුතු හෝ විසඳිය යුතු අධිකරණය ඒ අධිකරණය ලෙස නම් කළ යුතු ය. එමෙන් ම ඒ අනුව එසේ දෙනු ලැබූ බලය මත ඒ අධිකරණය විසින් ඒ විභාගය හෝ විසඳීම කළ යුතු ය. ඒ බලය දීම ඒ විභාගයේ හෝ විසඳීමේ කටයුත්තෙහි ලියවිලි සමග ගොනු කර තැබිය යුතු ය.

(4) මේ නියෝගයේ (2) වෙනි ඡෙදය යටතේ වූ නීතිපතිගේ තීරණයක් පහත සඳහන් වරදවලට අදාළ කළ හැකි ය:—

(අ) හදිසි නියෝග යටතේ ලංකාව මුළුල්ලේ ම හෝ ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක තැනැත්තන් විසින් කරන ලද යි කියනු ලබන සියලු ම වරදවල්,

(ආ) ලංකාව මුළුල්ලේ ම හෝ ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක යම් විශේෂ පන්තියක හෝ වර්ගයක තැනැත්තන් විසින් එසේ කරන ලද යි කියනු ලබන සියලු ම වරදවල්,

(ඇ) ලංකාව මුළුල්ලේ ම හෝ ලංකාවේ විශේෂ ප්‍රදේශයක තැනැත්තන් විසින් එසේ කරන ලදයි කියනු ලබන යම් විශේෂ පන්තියක හෝ වර්ගයක සියලු ම වරදවල්, හෝ

(ඈ) ලංකාව මුළුල්ලේ ම හෝ ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක යම් විශේෂ පන්තියක හෝ වර්ගයක තැනැත්තන් විසින් නොහොත් යම් විශේෂ තැනැත්තකු විසින් කරන ලද යි කියනු ලබන යම් විශේෂ පන්තියක හෝ වර්ගයක සියලු ම වරදවල්, හෝ

(ඉ) ලංකාව මුළුල්ලේ ම හෝ ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක යම් විශේෂ තැනැත්තකු විසින් කරන ලද යි කියනු ලබන යම් විශේෂ වරදක්.

(5) මේ නියෝගය බලපවත්නා කාලය තුළ, යම් අධිකරණයක හෝ ස්ථානයක සිට සෙසු යම් අධිකරණයකට හෝ ස්ථානයකට යම් සාපරාධ වරදක විභාගයක් හෝ නඩු විසඳීමක් මාරු කිරීමේ බලය නීතිපති වෙත පැවෙරෙන අධිකරණ ආඥාපනතේ 43 වෙනි වගන්තිය, එහි අතුරු විධානය බල නො පවත්නා විටක මෙන්, ක්‍රියාත්මක විය යුතු ය. 6 අධි.

(6) එසේ කිරීම අවස්ථානුකූල ය යි අගමැති විසින් සලකනු ලැබුවහොත්, පහත දැක්වෙන කරුණු සියල්ල හෝ ඉන් යමක් සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ආඥාවක් මගින් අගමැති විසින් විධිවිධාන සැලැස්විය හැකි ය :—

(අ) යම් පළාතක ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු වාර පැවැත්වීම නතර කිරීම හෝ අවසන් කිරීම ;

(ආ) යම් පළාතක ශ්‍රේෂ්ඨාධිකරණයේ නතර කරනු ලැබූ අපරාධ නඩු වාර කිසිවක දී විභාග කිරීම සඳහා සූදානම් ව තිබූ නඩු සියල්ල හෝ ඉන් කිසිවක් සෙසු යම් පළාතක ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් අපරාධ නඩු වාරයකට මාරු කිරීම ;

(ඇ) යම් පළාතක සියලු ම ප්‍රදේශ අධිකරණවල, සුළු අපරාධ අධිකරණවල හා ගම්සභා අධිකරණවල හෝ ඉන් යමක නඩු වාර පැවැත්වීම අත්හිටවීම හා ඒ අධිකරණවල එසේ අත්හිටවනු ලැබූ නඩු වාරයන්හි දී විභාගයට හෝ නඩු විසඳීමට සූදානම් ව ඇති සියලුම නඩු හෝ ඉන් යමක් අන්කිසි පළාතක ප්‍රදේශ අධිකරණවලට, සුළු අපරාධ අධිකරණවලට හා ගම්සභා අධිකරණ වලට මාර කිරීම ;

(ඈ) ආඥාව සහමුලින් ක්‍රියාවේ යෙදවීමේ හා බලපැවැත්වීමේ කාර්‍ය සඳහා විධිවිධාන සැලැස්වීමට අවශ්‍ය වූ සෙසු කරුණු.

(7) සෙසු යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද මේ නියෝගයේ (5) වෙනි ඡෙදය යටතේ අගමැති විසින් කරනු ලැබූ ආඥාවක නීතියේ බලය තිබිය යුතු ය.

7 වෙනි නියෝගය යටතේ සිරභාරයට ගනු ලැබූ හා රඳවා ගනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.

48. (1) මේ නියෝගවල 7 වෙනි නියෝගය යටතේ සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 36 වෙනි 37 වෙනි හා 38 වෙනි වගන්තිවල විධිවිධාන අදාළ නො විය යුතු ය.

(2) මේ නියෝගවල 7 වෙනි නියෝගයේ විධිවිධාන ප්‍රකාර පොලිස්පති විසින් බලය දෙනු ලැබූ ස්ථානයක රඳවා ගනු ලැබූ යම් තැනැත්තකු, ඒ නියෝගය යටතේ ඔහු සිරභාරයට ගනු ලැබූ දිනයේ සිට දින පහළොවකට නො වැඩි කාලයක් එ සේ රඳවා ගත හැකි ය. ඒ කාලසීමාව ඉකුත්වීමට පෙර ඒ ස්ථානය භාර නිලධරයා විසින් ඒ තැනැත්තා යම් අධිකරණයක් ඉදිරිපිටට ගෙනෙනු නො ලැබුවහොත් ඒ කාලසීමාව අවසානයේ දී ඒ නිලධරයා විසින් ඔහු නිදහස් කළ යුතු ය.

20 අයි.

(3) මේ නියෝගවල 7 වෙනි නියෝගයෙහි විධිවිධාන ප්‍රකාර සිරභාරයට ගෙන රඳවා ගනු ලැබූ තැනැත්තකු, මේ නියෝගයෙහි 2 වෙනි ඡෙදයෙහි සඳහන් කරනු ලැබූ නිලධරයා විසින් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් ඉදිරිපිටට ගෙනෙනු ලැබූ අවස්ථාවක අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 36 වෙනි හා 37 වෙනි වගන්ති ප්‍රකාර ඔහු අධිකරණය ඉදිරිපිටට ගෙනෙනු ලැබූ පරිද්දෙන් ම ඒ අධිකරණය විසින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් සියලු ආකාරයෙන් ම ක්‍රියා කළ හැකි ය.

නීතිපතිගේ අනුමතිය.

49. (අ) යම් හදිසි නියෝගයකට විරුද්ධ වරදක් සඳහා, හෝ

(ආ) ඒ නියෝගය යටතේ යම් බලතලයක් හෝ යුතුකමක් කෙළින් ම හෝ නො එසේ ව ක්‍රියාත්මක කරවීමේ දී හෝ ඉටු කිරීමේ දී හෝ කල්පිත ක්‍රියාත්මක කරවීමේ දී හෝ ඉටු කිරීමේ දී, කිරීමෙන් හෝ නොකර හැරීමෙන් පැන නැගුණු හෝ ඇති වූ වරදවල් සංගෘහිත වන ක්‍රියා හෝ නො කර හැරීම් වූ අන්කිසි ලිඛිත නීතියක් යටතේ තැනැත්තන් විසින් කරන ලද යි හෝ කියනු ලබන වරදක් සඳහා,

කිසි නඩු පැවරීමක් නීතිපති විසින් හෝ ඔහුගේ ලිඛිත අනුමතිය ඇති ව මිස, නො කළ යුතු ය.

(2) ආඥාවෙහි නියම කරනු ලැබූ යම් හදිසි නියෝගයකට විරුද්ධ යම් වරදක් සම්බන්ධයෙන් මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදයෙහි විධිවිධාන අදාළ නො විය යුතු ය යි අගමැති විසින්, ආඥාවෙන් ප්‍රකාශ කළ හැකි ය. තව ද ඒ අනුව ඒ ආඥාව බලපවත්වන තාක් ඒ වරදට ඒ ඡෙදය අදාළ නො විය යුතු ය.

අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ විභාග.

50. (1) අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ සියලු විභාග හෝ යම් විශේෂ විස්තරයක විභාග හෝ යම් විශේෂ විභාගයක් හෝ පැවැත්විය යුතු අධිකරණය නීතිපති විසින් නිශ්චය කළ හැකි ය. ඒ අධිකරණය ඒ විභාගයන්ට හෝ විභාගයට විෂය වන හෝ විෂයයන් වන සිද්ධි, ක්‍රියා හෝ දේවල්, නැතහොත් සිද්ධිය, ක්‍රියාව හෝ දෙය යම් අධිකරණයක අධිකරණ බලයෙහි ප්‍රාදේශික සීමා ඇතුළත සිදුවිණි නම්, ඒ විභාගයන් හෝ විභාගය පැවැත්වීමට අධිකරණ බලය ඇති අධිකරණය විය යුතු ය.

(2) මේ නියෝගයෙහි (1) වෙනි ඡෙදය යටතේ අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ විභාග හෝ විභාගය පැවැත්විය යුතු අධිකරණය නීතිපති විසින් නිශ්චය කළ විට, ඔහු විසින් ඔහුගේ ලිඛිත විධානයක මාර්ගයෙන් ඒ විභාග හෝ විභාගය පැවැත්විය යුතු අධිකරණය නම් කළ යුතු ය. තවද ඒ අනුව ඒ විධානයේ බලය පිට ඒ අධිකරණය විසින් විභාග හෝ විභාගය පැවැත්විය යුතු ය. ඒ විභාග හෝ විභාගය පැවැත්වීමට අන් කිසි ම අධිකරණයකට අධිකරණ බලය නොමැති විය යුතු ය.

(3) මේ නියෝගයෙහි '' විභාගය '' යන පාඨයට සුළු අපරාධ අධිකරණයක් ඉදිරිපිට හෝ පරීක්ෂකයකු විසින් හෝ අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පවත්වනු ලබන හැම විභාගයක් හා හැම ඉන්ක්වැස්ට් විභාගයක් ද ඇතුළත් වේ. තව ද '' විභාග '' යන පාඨය ද ඒ අනුව තේරුම් ගත යුතු ය.

(4) මේ නියෝගයෙහි විධිවිධාන, ඊට පටහැනි ව අන්කිසි ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, බල පැවැත්විය යුතු ය.

රඳවා ගැනීම හා ඇප.

51. (1) පොලිසියෙහි, ලංකා යුද්ධ හමුදාවෙහි, රාජකීය ලංකා නාවික හමුදාවෙහි, හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවෙහි යම් සාමාජිකයකු සම්බන්ධයෙන්—

(අ) නො එසේ වූ අන් අවස්ථාවක දී, ඒ සාමාජිකයා සිරභාරයට ගැනීමට හෝ රඳවා ගැනීමට නියම කිරීමට හෝ ඒ සාමාජිකයා විසින් ඇප දිය යුතු ය යි අණ කිරීමට හිමිකම් තිබූ අධිකරණයක් විසින් හෝ

(ආ) මේ නියෝග වලංගු වීමේ දිනයට පෙර අධිකරණයක් විසින් කරන ලද ආඥාවක් අනුව ඒ සාමාජිකයා තම භාරයෙහි රඳවා ගෙන සිටින පිස්කල් විසින්,

බලය ලත් නිලධාරියකු ඊට සුදුසු සහතිකය ඉදිරිපත් කළ විට, ඒ නිලධාරියාට ඔහු භාර දිය යුතු ය.

(2) පොලිසියෙහි, ලංකා යුද්ධ හමුදාවෙහි, රාජකීය ලංකා නාවික හමුදාවෙහි, හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවෙහි යම් සාමාජිකයකු මේ නියෝගය කඩ කරමින් සිරභාරයට ගතහොත් හෝ රඳවා ගතහොත්, ඒ සාමාජිකයා සියලු කාර්‍යයන් සඳහා නීති විරෝධී ලෙස රඳවා ගෙන සිටින ලෙස සැලකිය යුතු ය.

(3) මේ නියෝගය යටතේ අධිකරණයක් විසින් බලය ලත් නිලධාරියකුට භාර දෙන ලද තැනැත්තන් අධිකරණය විසින් අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය යි ඉල්වා සිටින කවර විටක දී වුවද, එසේ කිරීම ඒ බලය ලත් නිලධාරියාගේ යුතුකම විය යුතු ය.

(4) මේ නියෝගය යටතේ බලය ලත් නිලධාරියකු විසින් නිකුත් කරන ලද යි ඇඟවෙන සහතිකයක් එහි සඳහන් කර ඇති කරුණු පිළිබඳවත්, එසේ සහතිකයක් නිකුත් කිරීමට ඔහු සතු බලය පිළිබඳවත්, තීරණාත්මක සාධක විය යුතු ය.

(5) මේ නියෝගයෙහි කාර්යයන් සඳහා—

යම් තැනැත්තකු සම්බන්ධයෙන් '' සුදුසු සහතිකය '' යන්නෙන්, ඒ තැනැත්තා පොලිසියෙහි හෝ ලංකා යුද්ධ හමුදාවෙහි හෝ රාජකීය ලංකා නාවික හමුදාවෙහි හෝ රාජකීය ලංකා ගුවන් හමුදාවෙහි සාමාජිකයකු බව දක්වමින් බලය ලත් තැනැත්තකු විසින් නිකුත් කර ඇති සහතිකයක් අදහස් වේ.

'' බලය ලත් නිලධරයා '' යන්නෙන්,—

(අ) පොලිසියෙහි යම් සාමාජිකයකු සම්බන්ධයෙන්, පොලිස්පති හෝ මේ නියෝගයන් යටතේ ක්‍රියා කිරීම සඳහා ඒ අතින් ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් පොලිස් නිලධරයකු අදහස් වේ ;

(ආ) ලංකා යුද්ධ හමුදවෙහි යම් සාමාජිකයකු සම්බන්ධයෙන්, යුද්ධ හමුදවෙහි අණ දෙන නිලධාරියා හෝ මේ නියෝගයන් යටතේ ක්‍රියා කිරීම සඳහා ඒ අතින් ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ ඒ යුද්ධ හමුදවෙහි යම් නිලධාරියකු අදහස් වේ ;

(ඇ) රාජකීය ලංකා නාවික හමුදවෙහි යම් සාමාජිකයකු සම්බන්ධයෙන්, නාවික හමුදවෙහි කපිතන් තැන හෝ මේ නියෝගයන් යටතේ ක්‍රියා කිරීම සඳහා ඒ අතින් ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ ඒ නාවික හමුදවෙහි යම් නිලධාරියකු අදහස් වේ ;

(ඈ) රාජකීය ලංකා ගුවන් හමුදවෙහි යම් සාමාජිකයකු සම්බන්ධයෙන් ඒ ගුවන් හමුදවෙහි අණ දෙන නිලධාරියා හෝ මේ නියෝගයන් යටතේ ක්‍රියා කිරීම සඳහා ඒ අතින් ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ ඒ ගුවන් හමුදවෙහි යම් නිලධාරියකු අදහස් වේ.

(6) අන්කිසි ලිඛිත නීතියක මීට පටහැනි ව කුමක් සඳහන් වුව ද, මේ නියෝගයන්හි විධිවිධාන බල පැවැත්විය යුතු ය.

52. (1) ආයාචනයේ දී ශ්‍රෙෂ්ඨාධිකරණය විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ XXX වෙනි පරිච්ඡෙදය යටතේ නඩුවක් තීරණය කරනු ලැබූ හෝ තීරණය කරනු ලබන අවස්ථාවක ඒ ආයාචනය සම්බන්ධයෙන් ශ්‍රෙෂ්ඨාධිකරණයේ ආඥාව සමග අනුකූල හා එකඟ වීම සඳහා ඒ සංග්‍රහයෙහි 350 වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තිය යටතෙහි කළයුතු ය යි නියමිත නඩුවෙහි වාර්තා පිළිබඳ සියලු හෝ යම් ආඥා හා සියලු හෝ යම් සංශෝධන, එබඳු වෙනත් අධිකරණයක විනිශ්චයට හෝ ආඥාවට විරුද්ධ ව කරනු ලැබූ ආයාචනයක් නම්, ඒ ආයාචනය පිළිබඳ ආඥාව ශ්‍රෙෂ්ඨාධිකරණය විසින් යම් අධිකරණයකට සහතික කරනු ලැබුවේ ද ඒ අධිකරණය විසින් නොව, ස්වකීය ආඥාව වෙන යම් අධිකරණයකට සහතික කිරීමට ඒ සංග්‍රහයෙන් ශ්‍රෙෂ්ඨාධිකරණයට නියම කරනු ලැබුවේ ද ඒ අධිකරණය විසින් කළ යුතු ය යි නීතිපති විසින් තීරණය කළ හැකිය.

ආයාචනයේ දී ශ්‍රෙෂ්ඨාධිකරණයේ තීරණයෙන් පැන නගින ඇතැම් කරුණු සම්බන්ධයෙන් නීතිපතිගේ බලය.

(2) ආයාචනයේ දී ශ්‍රෙෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබූ යම් නඩුවක් සම්බන්ධයෙන් මේ නියෝගයෙහි (1) ඡෙදයෙහි සඳහන් ආඥා හා සංශෝධන, කළ යුතු අධිකරණය ඒ ඡෙදය යටතෙහි නීතිපති විසින් තීරණය කරනු ලබන අවස්ථාවක ඒ ආඥා හා සංශෝධන කළ යුතු අධිකරණය වශයෙන් ඔහුගේ ලිඛිත නියෝගයෙන් ඒ අධිකරණය නම් කළ හැකි ය. ඉක්බිති ව—

(අ) ඒ ආයාචනය සම්බන්ධ ශ්‍රෙෂ්ඨාධිකරණයෙහි ආඥාව සහතික කරනු ලැබුවේ යම් අධිකරණයකට ද ඒ අධිකරණය විසින් ඒ නඩුවෙහි වාර්තාව සමග එසේ සහතික කරනු ලැබූ ඒ ආඥාව, ආයාචන පෙත්සම හා එසේ සහතික කරනු ලැබූ ඒ ආඥාව සඳහා ශ්‍රෙෂ්ඨාධිකරණය විසින් දෙනු ලැබූ (යම් හේතු වේ ද) හේතුවල පිටපතක් ද එසේ නම් කරනු ලැබූ අධිකරණයට යැවිය යුතු ය ;

(ආ) තවද එසේ නම් කරනු ලැබූ අධිකරණය විසින් එසේ සහතික කරනු ලැබූ ඒ ආඥාව හා ඒ වාර්තාව හා (යම් පිටපතක් වේ ද) පිටපත ද ලැබීමෙන් පසු, ඒ ආයාචනය පිළිබඳ ශ්‍රෙෂ්ඨාධිකරණයේ ආඥාව සහතික කරනු ලැබුවේ යම් අධිකරණයකට ද ඒ අධිකරණය විසින් නොව, ඒ නියෝගයේ බලය ප්‍රකාර නම් කරනු ලැබූ අධිකරණය විසින් ඒ ආඥා හා සංශෝධන කළ යුතු ය.

ඒ නඩුවෙහි නීති කෘත්‍ය සමග ඒ නියෝගය ලේඛන ගත කළ යුතු ය. ඒ නියෝගයෙහි බලය පිට එසේ නම් කරනු ලැබූ අධිකරණය විසින් කරනු ලැබූ සියලු ආඥා හා සංශෝධන ද ඒ ආඥාවල ප්‍රතිඵලයක් වශයෙන් කරනු ලැබූ කුමන අන්දමේ හෝ සියලු ක්‍රියා හා දේවල් සියලු කාර්යයන් සඳහා වලංගු හා ක්‍රියාත්මක වන බව සලකනු ලැබිය යුතු ය.

(3) අපරාධ නඩු විධාන සංග්‍රහයේ හෝ වෙනයම් නීතියක විධිවිධානවල විරුද්ධව කුමක් සඳහන් වුවද මේ නියෝගයේ පෙරාතුව විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. 20 අධි.

53. ලංකා යුද්ධ හමුදවේ, රාජකීය ලංකා නාවික හමුදවේ හෝ රාජකීය ලංකා ගුවන්හමුදවේ ස්ථිර බල හමුදවේ හැම සාමාජිකයකු —

රේගු නිලධරයන් වශයෙන් සේවා භටයන් යෙදවීම.

(අ) රේගු ආඥාපනතෙහි 118, 125, 126, 127, 135 හා 143 වෙනි වගන්තිවල කාර්යය සඳහා, රේගු සේවයෙහි සේවය කළ යුතුය. තව ද ඒ කාර්යයන් සඳහා, රේගුවෙහි නිලධරයන් වෙත ඉහත කී වගන්තිවලින් පැවැරණු බලතල පාවිච්චි කළ යුතුය. 235 අධි.

(ආ) තවද ආගමන හා විගමන පනතෙහි දී තිබෙන අර්ථය ඇතුළත හා එහි කාර්යයන් සඳහා බලය ලත් නිලධරයකු ලෙස සැලකිය යුතුය. ඒ අනුව, ඒ පනතින් හෝ ඒ පනත යටතේ බලය ලත් නිලධරයන් වෙත පැවැරණු හෝ නියම කරනු ලැබූ බලතල, යුතුකම් හෝ කාර්යයන් පාවිච්චි කළ යුතුය ; ඉෂ්ට කළ යුතුය ; නැතහොත් ක්‍රියාවේ යෙදවිය යුතුය. 351 අධි.

54. (1) අගමැති විසින් ආඥාවක මාර්ගයෙන් සඳහන් කරනු ලැබූ ලංකාවේ යම් ප්‍රදේශයක —

ගිනි තැබීම, කොල්ලකෑම හා අයුතු ඇතුළුවීම.

(අ) ගින්නෙන්, යම් දෘශ්‍ය පදර්ථයකින්, යම් පුපුරන ද්‍රව්‍යයකින්, විඛාදන ද්‍රව්‍යයකින් හෝ යම් අන්දමක දමාගසන ආයුධයකින්, ආයුධයකින් හෝ උපකරණයකින් චංචල හෝ නිශ්චල දේපළකට විනාශයක් හෝ හානියක් සිදු කරන, හෝ ඒ දේපළ රජයට, හෝ යම් ප්‍රාදේශීය බලමණ්ඩලයකට, හෝ යම් පුද්ගලයකුට හෝ පුද්ගල මණ්ඩලයකට අයිති වුවද, එබඳු යම් දේපළක වටිනාකම නැති කරන හෝ ප්‍රයෝජනය අඩු කරන අන්දමේ යම් වෙනසක් ඇති කරන යම් ක්‍රියාවක් කරන ; හෝ

(අඅ) ගින්නෙන් හෝ යම් දැවෙන ද්‍රව්‍යයකින් හෝ යම් පුපුරන හෝ විඛාදන ද්‍රව්‍යයකින් හෝ යම් අන්දමක දමාගසන ආයුධයකින්, ආයුධයකින් හෝ උපකරණයකින් හෝ යම් විස්තරයක ආයුධයකින් අන්කිසි තැනැත්තකුට මරණය හෝ තුවාළ සිදු කරන හෝ එබන්දක් කිරීමට තැත් කරන ; හෝ

(ආ) හිස්ව හෝ ආරක්ෂා රහිතව තිබෙන්නට ඉඩ හැර ඇති යම් භූමියකදී යම් භාණ්ඩයක් සොරකම් කරන ; හෝ

(ඇ) අත්‍යාවශ්‍ය සේවාවන් ඉටු කිරීමේදී පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් වාහනයක, යන්ත්‍රයක, උපකරණයක හෝ වෙනත් දෙයක කාර්‍යක්ෂමතාව දුර්වල කිරීම හෝ ක්‍රියාකාරිත්වයට බාධා කිරීම හෝ ඉහත දක්වෙන පරිදි පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන යම් නිර්මානයක, ගොඩනැගිල්ලක හෝ භූමියක ප්‍රයෝජන අඩු කිරීම ඒ ක්‍රියාවෙන් සිදුවිය හැකි යයි අදහස් කරමින් හෝ ඒ බව දන දනම හෝ ඒ බව විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු සහිතව යම් ක්‍රියාවක් කරන ; හෝ

19 අයි. (ඈ) දණ්ඩ නීති සංග්‍රහයේ අංක 427 සිට අංක 446 තෙක් වූ වගන්ති අතුරෙන් යමක් යටතේ යම් වරදක් සිදු කරන හෝ යම් භූමියකින් යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන ; හෝ

(ඉ) දණ්ඩ නීති සංග්‍රහයේ 138 වෙනි වගන්තියෙහි විස්තර කරනු ලබන පරිදි, ඉහත දක්වෙන අනුච්ඡෙද අතුරෙන් යමක සඳහන් යම් ක්‍රියාවක් කිරීමේ පරමාර්ථය වන නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වන,

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතුය. තව ද, දණ්ඩ නීති සංග්‍රහයෙහි හෝ මේ නියෝගවල කුමක් සඳහන් වුව ද, ශ්‍රෙෂ්ඨාධිකරණය ඉදිරියේ වරදකරු වූ විට, මරණ දඬුවමට හෝ ජීවිතාන්තය දක්වා දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමට යටත් විය යුතුය.

(2) දේපළ පුද්ගලිකව ආරක්ෂා කිරීම පිළිබඳ අයිතිවාසිකමට අදාළ වන්නාවූද ඒ අයිතිවාසිකම පාවිච්චි කිරීමේ දී වරද කරන්නකුට මරණය හෝ වෙනත් හානියක් සිදු කරවනු ලැබිය හැක අවස්ථා නියම කරන්නාවූ ද දණ්ඩ නීති සංග්‍රහයේ 96 වෙනි වගන්තිය, ඒ වගන්තිය අවසානයේදී පහත දක්වෙන පාඨය එකතු කරනු ලැබූ සේ බල පැවැත්විය යුතුය :—

"පස්වනුව—හදිසි විවිධ විධිවිධාන හා බලතල නියෝගයන්හි 54 වෙනි නියෝගය යටතේ යම් වරදක්".

(3) වරද කරන වේලාවෙහි හෝ අවස්ථාවෙහි පැවති මහජන කැළඹීම වර්ධනය කිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් හෝ එබන්දකදී වරද කරනු ලැබූ බවට නීතිපති සෑහීමට පත්වන්නේ නම්, මේ නියෝගය යටතේ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් සඳහා, මේ නියෝගවල 49 වැනි නියෝගය යටතේ නීතිපති ගේ ලිඛිත අනුමැතිය දිය හැකිය.

ප්‍රශ්නවලට පිළිතුරු දීමේ යුතුකම.

55. අන්කිසි නීතියක පටහැනි ව කුමක් සඳහන් වුවද, යම් හදිසි නියෝගයක් යටතේ සිරභාරයට ගෙන රඳවා ගනු ලැබූ යම් තැනැත්තකු, එසේ සිරභාරයට ගෙන නතර කර ගැනීමේ කාල සීමාව ඇතුළත පොලිස් නිලධරයකු විසින් හෝ යුද්ධ හමුදාවේ අණ දෙන නිලධරයා, නාවික හමුදාවේ කපිතන් හෝ ගුවන් හමුදාවේ අණ දෙන නිලධරයා විසින් බලය දෙනු ලැබූ අන්කිසි නිලධරයකු විසින් හෝ ප්‍රශ්න කරනු ලැබීමට යටත් විය යුතු ය. තව ද තමාගෙන් අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු දීම එසේ ප්‍රශ්න කරනු ලැබූ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

මෘත ශරීර ස්වාමිත්වයට ගැනීම හා භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම.

56. උප පොලිස් අධිකාරිවරයකුගේ නිලයට අඩු නො වන නිලයක් දරන යම් පොලිස් නිලධරයකු විසින් හෝ පොලිස් ස්ථානයක් භාරව සිටින යම් නිලධරයකු විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ වෙන යම් නිලධරයකු හෝ තැනැත්තකු විසින් යම් මෘත ශරීරයක් ස්වාමිත්වයට ගැනීම, හා භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම හා එබඳු භූමදානය හෝ ආදාහනයක් සම්බන්ධයෙන් හෝ එබඳු භූමදානයක හෝ ආදාහනයක කාර්යය සඳහා යම් රැස්වීමකට පැමිණ සිටීමට ස්වකීය අභිමතය අනු ව අවසර දිය හැකි තැනැත්තන් නිශ්චය කිරීම ද නීත්‍යානුකූල විය යුතු ය ; තව ද ඒ නිලධරයාගේ හෝ බලය ලත් තැනැත්තාගේ අවසරය නො මැතිව එබඳු රැස්වීමක සිටින හෝ මෙහි මින් පෙර පවරනු ලැබූ බලතල ක්‍රියාවේ යෙදවීමේ දී ඒ නිලධරයාට හෝ බලයලත් තැනැත්තාට අවහිර කරන යම් තැනැත්තකු වරදක් සම්බන්ධ යෙන් වරදකරු විය යුතු ය.

මේ නියෝගය යටතේ මෘත ශරීරයක ස්වාමිත්වය හා භූමදානය හෝ ආදාහනය සම්බන්ධයෙන් පියවර ගන්නා යම් නිලධරයකු හෝ තැනැත්තකු විසින් හදිසි මරණ පරීක්ෂණයට හෝ භූමදානයට හෝ ආදාහනයට අදාළ වෙන යම් ලිඛිත නීතියක විධිවිධාන අනු ව ක්‍රියා කිරීම අවශ්‍ය නො විය යුතු ය.

ප්‍රාදේශීය බලමණ්ඩලවල ඡන්ද විමසීම.

57. වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, (262 වැනි අධිකාරය වන) ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත යටතේ යම් ප්‍රාදේශීය බලමණ්ඩලයකට සභිකයකු පත් කිරීමේ කාර්යය සඳහා, පැවැත් විය යුතු යම් ඡන්ද විමසීමක්, මේ නියෝගය බලපැවැත්වෙනතාක් හා ඒතාක් පමණක් පවත්වනු නො ලැබිය යුතුය. මේ නියෝගයෙහි "ප්‍රාදේශීය බලමණ්ඩලය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වෙයි.

ඇතැම් ප්‍රාදේශිය බල මණ්ඩලවල නිල කාලය දීර්ඝ කිරීම.

58. වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, මීට යාකොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ප්‍රාදේශිය බල මණ්ඩලයේ දනට නිලයෙහි සිටින සභිකයන්ගේ නිල කාලය, මේ නියෝගය බල රහිත වන දිනය දක්වා මෙයින් දීර්ඝ කරනු ලැබේ.

උපලේඛනය

**සුළු නගර සභා**

වාද්දුව සුළු නගර සභාව
වෙල්වෙට්ටිතුරෙයි සුළු නගර සභාව
කල්මුනෙයි සුළු නගර සභාව

**ගම්සභා**

**කොළඹ දිස්ත්‍රික්කය**

නාරන්වල ගම්සභාව
කැළණිය ගම්සභාව

**මහනුවර දිස්ත්‍රික්කය**

මැදපළාත උඩුනුවර ගම්සභාව

**පුත්තලම් දිස්ත්‍රික්කය**

යටකලන්පත්තු ගම්සභාව
මුන්නේස්වරම් පත්තු ගම්සභාව

**යාපනය දිස්ත්‍රික්කය**

මුහමාලෙයි ගම්සභාව
පුලෝලි ගම්සභාව
චුලිපුරම් ගම්සභාව

**ගාල්ල දිස්ත්‍රික්කය**

කොස්ගොඩ ගම්සභාව

**මාතර දිස්ත්‍රික්කය**

කඹුරුපිටිය ගම්සභාව

**මන්නාරම් දිස්ත්‍රික්කය**

මුසාලි උතුර ගම්සභාව
පනන්කාමම් ගම්සභාව

**ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය**

කින්නියා ගම්සභාව.

ඇතැම් ගම්සභාවල පරිපාලනය ඒ ඒ පරිපාලන දිසාවල සහකාර පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත පැවරීම.

59. වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, මෙයට යා කොට ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් එක් එක් ගම්සභාවේ කටයුතු පරිපාලනය කිරීම ඒ එක් එක් ගම්සභාවේ ගම් ප්‍රදේශය පිහිටා ඇති පරිපාලන දිසාවෙහි සහකාර පළාත් පාලන කොමසාරිස් වෙත, මෙම නියෝගය බලපවත්නා තාක් හා ඒ තාක් පමණක්, පැවරිය යුතුය ; තවද එපරිද්දෙන් ඒ එක් එක් ගම්සභාවේ කටයුතු පරිපාලනය පැවරී ඇති සහකාර පළාත් පාලන කොමසාරිස් විසින් ඉහත කී කාලසීමාව තුළ (257 වෙනි අධිකාරය වන) ගම්සභා ආඥපනත යටතේ හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ ගම්සභාවේ සහ එහි සභාපතිගේද බලතල පාවිච්චි කිරීම හා යුතුකම් ඉටුකම් ඉටුකිරීම කළ යුතුය.

උපලේඛනය

**මන්නාරම් දිස්ත්‍රික්කය**

මන්තායි බටහිර ගම්සභාව.

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

කුඹුක්වැව ගම්සභාව

**රත්නපුර දිස්ත්‍රික්කය**

මාරපොන ගම්සභාව
පැල්මඩුල්ල ගම්සභාව

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙනහිර කඩදාසි සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි